

# මාසතීලක්ෂණය.

# මාසත්‍රීලක්‍ෂණය.

හෙවත්

පක්‍ෂ මාස ඍතු ලක්‍ෂණ හා

අධිමාස දැනගැනීම

පිණිස

සී. සුමඞ්ගල සාමීන් විසින්

නානා තන්ත්‍රවලින් කරුණු

ගෙනැ

සඞ්ග්‍රහ කරණ ලද

මේ පොත

බුද්ධවර්‍ෂ—2418—වෙදී

ඩී. සී. ප්‍රේරා විසින්

කොළඹ

ශාස්ත්‍රාලෝක යන්ත්‍රයෙහි

අච්චුගස්වන ලදී.

1874.

## ශුද්ධි පත්‍රය.

| පිටේ. | පෙලේ. | වරද. | නිවරද. |
|---|---|---|---|
| 8 | 6 | අමාවස්‍ය | අමාවාස්‍ය |
| ,, | 12 | මාසීය | මාසීය |
| ,, | 33 | සතාඥු | තාඥු |
| ,, | 35 | වේ | වේද |
| 9 | 21 | මාගීනශීෂීසී | මාගීශීෂී |
| 11 | 11 | තුනකිත් | තුනකින් |
| 11 | 25 | නිසණ්ඩු | නිසණ්ටු |
| 16 | 31 | ඔරෙනබො | ඔරෙනවෙ |
| ,, | 32 | සාටිකං | සාටික චීවරං |
| 18 | 32 | පූනාරුනු | පූනාඃරුණු |
| 20 | 1 | අධික | අධික |
| 22 | 18 | ඵාලගුණඃ | ඵාලගුනඃ |
| 44 | 26 | නිවහං | නිවහං |
| 26 | 10 | ඉටසියාදීගි යනු | ඉටඨයාදීගි කියාද |
| 28 | 16 | ඒසො යනු | ඒයො කියාද |

පොත් ටිකගණනක අච්චුගැසී ඇති.

# මාසත්ලක්ෂණය.

නමශ්ශාක්‍ය සිංහාය.

ප්‍රකාශයන්තො වචනානි යස්‍ය
රවෙරිවාභාඃ සකලාංශ්ච කාලාන්
සවො හිතායාස්තු ජගද්ධිතස්‍ය
විවාදභෙදී කුලිශාසනො ජිනඃ.

උපෙන්ද්‍රවජ්‍රා වංශස්ථ මිශ්‍රිතොපජාතිඃ.

යෙසුම්මුනීන්ද්‍ර ත්‍රනයාභි නවා විනීතා
මාසත්‍රිභෙදමිහ නාව ගතාඃ ප්‍රභූතාඃ.
තෙෂාං හිතාය සුගතශ්‍රී මනොපසූනතාං
තල්ලක්ෂණං ලඝුලිලික්ෂු රහාත්‍රිද්ධිනිම්.

අල්පබොධාත් ප්‍රමාදාද්වා යදසම්‍යක් ප්‍රලිඛ්‍යතෙ.
නිම්ත්සරාස්තු තද්බුද්ධා ශොධයන්තු මනීෂිණඃ.

සර්වමිථ්‍යාවාද නෙළිවූ සර්වඥයන්වහන්සෙ විසින් " අනුජානාමි භික්ඛවෙ සබ්බෙහෙව පක්ඛගණනං උග්ගහෙතුං"යි

මහණෙනි සියලුභික්ෂූන් විසින්ම පක්ෂගණනා ඉගෙනගන්ට අනුදනිමියි, අනුදැනවදාළ තිබියදීත් භික්ෂූන් සියල්ලන්විසින් පක්ෂ මාස සෘතු පිළිවෙළ ඉගෙන නොගැන්මෙන් පොහෝ කිරීම් වස්එලඹීම් පවුරුණුකිරීම් වැසිසළු සෙවීම් කිරීම් ඉටීම්ආදි කටයුතු පැමිණිකල්හි ඒ ඒ පක්ෂ මාසාදිය නත්වූ පරිද්දෙන් නොදැනීමෙන් ඇතම් කාලවලදී වරදවා කිරීමෙන් ශික්ෂා පදයන් ඉක්මවා පිළිපදනා හෙයින් ඒ මනාකොට පිළිපදිනා පිණිස, සියලු භික්ෂූන්විසින් පක්ෂ මාස සෘතු පිළිවෙළ ඉගෙනගත යුතුයි

එහෙසින් ඒ පිළිවෙළ අභිනව ශිෂ්‍යයන් විසින් සැපසේ දැන ගන්නා පිණිස සංක්ෂෙපවූ මාසතී ලක්ෂණයක් ලියනෙමි— ඒ මෙසේයි—

"අෂ්ටා දශනිමෙෂාස්තු කාෂ්ඨාඃ ත්‍රිංශත්තුතාඃ කලාඃ
තාස්තු ත්‍රිංශත් ක්ෂණස්තෙතු මුහූර්තො ද්වාදශාස්ත්‍රියාම්."

"තෙතු ත්‍රිංශදහොරාත්‍රඃ පක්ෂස්තෙ දශ පඤ්චච.
පක්ෂෞ පූර්වාපරෞ ශුක්ල කෘෂ්ණෞ මාසස්තු තාවුභෞ"

යනුහෙසින්, ඇසිපිය හෙලන කාලසංඛ්‍යාත නිමෙෂ කාල දසඅටක් එක කාෂ්ඨාවෙකි, එබඳු කාෂ්ඨා තිසක් කලාවෙකි, එබඳු කලා තිසක් ක්ෂණයෙකි, ක්ෂණ දොළසක් මුහූර්තයෙකි, මුහූර්තයෙක්නම් දෙපැයෙකි, එබඳු මුහූර්ත තිසක් රෑදවලෙකි, නොහොත් දිනකි, ඒ රෑදවල් පසළොසක් පක්ෂ යෙකි, ශුක්ලකෘෂ්ණ සංඛ්‍යාතවූ පූර්වාපර පක්ෂ දෙකෙක් එක මසක් ය යනුභාවයි—

මෙකියනලද පරිද්දෙන් පක්ෂයක් පසළොස් දවසක් ඇත්තේ වේ— එතකුදු වුවත් ඒ බහුල වශයෙනැයි දතයුතු, තුදුස් දවසින් වන්නාවූ පක්ෂයෙක්ද ඇත්මැයි—එනි චන්ද්‍රසූර්‍ය්‍ය දෙදෙනාගේ එකතුවීම් සංඛ්‍යාත අමාවක ගිය කලැ පුර පැළවිය පටන් ක්‍රමයෙන් වැඩෙන්නාවූ චන්ද්‍රයා සූර්‍ය්‍ය කෙරෙන් දුරුව ගොස් හිරු සිටිය රැසට සත්වෙනි රැස නකත් ගණනින් හිරු සිටි නකතින් තුදුස්වෙනි නකතට පැමිණ පරිපූර්ණ මණ්ඩලයෙන් යුක්තවූ පෞර්ණමාසී දිනදක්වා වන පක්ෂය ශුක්ලපක්ෂ නම්, චාන්ද්‍රමාසයාගේ පූර්වභාගය හෙයින් පූර්වපක්ෂ නමුදු වේ—පෞර්ණමාසී දිනට ඉක්බිතිව චන්ද්‍රයා සූර්‍ය්‍යාකාර යන ගමනින් චන්ද්‍රමණ්ඩලය පිරිහෙන්ට පටන්ගත් අවපැළවිය දිනපටන් ක්‍රමයෙන් මණ්ඩලය පිරිහිමෙන් ගොස් සූර්‍ය්‍ය සමග එක්වන අමාවක් දිනදක්වා වන පසළොස්දවස කෘෂ්ණ පක්ෂනම්, ඒ චාන්ද්‍රමාසයාගේ අපරාර්ධය හෙයින් අපර පක්ෂ නමුදු වේ—කෘෂ්ණ පක්ෂය ඇතම් කලෙක තුදුස් දවසින් ඌනතාවේ—මේ පක්ෂදෙක එකක්වූ කලැ එක් චාන්ද්‍රමාසයෙකි—මාස යනු ප්‍රධාන වශයෙන් චාන්ද්‍රමාසයයි—අප්‍රධාන වශයෙන් සූර්‍ය්‍ය එකරාශියක් නොහොත් නකත් නව පාදයක් වලඳන කාලයද මාස නම්—මා, යනු චන්ද්‍රයායි—අස, යනු අස භක්ඛණෙ යන ධාතු රූපයි, එහෙයින්, මා චන්දො, රාසි චක්ක සඤ්චාර වසෙන එකං වාරං යං කාලං අසති සො මාසො, මසතීති වා මාසොති අර්ථ ගතයුතුයි—

චාන්ද්‍රමාසයද පූරපැළවීය පටන් අමාවක දක්වා වන චාන්ද්‍රමාසය, තුන් සෘතු යෙදෙන පිළිවෙළින් අවපැළවිය පටන් පූර පසළොස්වක දක්වා වන චාන්ද්‍රමාසයයි කියා දෙවැදෑරුම් වේ- එයින් නකත්යෙදීමේ පිළිවෙළින් පූර පැළවියෙන් පටන්ගන්නා මාසය ප්‍රධානවසයෙන් දඹදිව ආදි බොහෝ රටවලැ ව්‍යවහාර කෙරෙත්—පූර පසළොස්වකින් පසු අව් පැළවියෙන් පටන්ගන්නා චාන්ද්‍රමාසය වස්එළඹීම් පවාරණ කිරීම් සෘතු අවසන් කිරීම් ආදියට මධ්‍යදෙශ යෙහිද ප්‍රත්‍යන්තවලද ව්‍යවහාර කෙරෙත් —වස්එළඹීම් ආදියපිණිස ඒ මාස පිළිවෙළින්ම මාසයෝ ගැඳින ගත යුතුයි—එයින් පූර පැළවිය පටන් අමාවාසිය දක්වා පවත්නා මාසය ගැඳින ගත්කලැ අවපැළවියෙන් පටන් ගන්නා මාසය එයින් ගැඳිනේ—එනම්—පළමුවෙන්කී චාන්ද්‍රමාසයේ මධ්‍යය දෙවනුව කී මාසයාගේ අන්තයට පැමිණෙනුම්ස එකකට එකක් නොබැඳී මාසයක් දුරුව නොයන හෙයිනි—එයින් පළමු කී මාස ක්‍රමය මධ්‍යදෙශය ආදි තන්හි පවත්නාබව මෙසේ දන්නේයි—මධ්‍යදෙශයෙහි කාසි ජනපදයෙහි ගංගා තීරයෙහි විසූ කුල්ලූක භට්ටාචාර්‍ය්‍යව රයා කළ මන්වර්ථ මුක්තාවලියෙහි—

“ජ්‍යොතිඃ ශාස්ත්‍රෙ චෛත්‍ර ශුක්ලප්‍රතිපදාදි වර්ෂගණනාත් ශිශිරෙණ සමාපෙත වර්ෂෙ වසන්තෙ සොමරසසාධ්‍යෙ රග්නිෂ්ටොමාදි යාගෛර්යජෙත්”—ජ්‍යොතිඃ ශාස්ත්‍රයෙහි චෛත්‍රමාස ශුක්ලපක්ෂ යෙහිවූ පැළවිය ආදිකොට වර්ෂ ගණනා හෙයින් ශිශිරසෘතුවෙන් වර්ෂය සමාප්තවූකලැ වසන්ත සෘතුවෙහි සොම රසයෙන් සිද්ධකටයුතුවූ අග්නිෂ්ටොමාදි යාගවලින් පුදන්නේයි—මෙයින් චෛත්‍ර පූර පැළවිය පටන් වර්ෂය ගන්නාබැව් පෙනෙන හෙයින් පූරපැළවිය පටන් ගන්නා මාසක්‍රමය මධ්‍යදෙශාදි රටවලැ පවත්නා බව ප්‍රකාශ වන්නේයි—*—ඒමාසය පටන්ගන්නේ කොතැනදීද ගෙවෙන්නේ කොතැනදීද යත්—කාල විධානයෙහි ලක්ෂණ පූර්වක් “මාසෙ මාසෙ ඵාල්ගුනෙ පෞර්ණමී ස්‍යුතෙ”යනාදි ශ්ලොකයේද,කාලවිධාන ටීකාවෙහි

---

* සූර්‍ය්‍ය සිද්ධාන්ත ටීකාවෙහි—“තත්‍ර දර්ශාන්තා වධිකඃ පූර්ණිමාන්තා වධිකශ්ච ශාස්ත්‍රෙ මුඛ්‍යතයා ප්‍රතිපාදිතඃ අත්‍ර, ශාස්ත්‍රෙ තු දර්ශාන්තාවධිකඑව මුඛ්‍යඃ”—එහි අමාවක අන්තකොට ඇත්තාවූද පූර පසළොස්වක අන්තකොට ඇත්තාවූ ද මාසය ශාස්ත්‍රයෙහි ප්‍රධානත්වයෙන් පිළිගෙල කරණ ලදී-මේ ශාස්ත්‍රයෙහි වනාහි අමාවක සීමා කොට ඇත්තේම ප්‍රධානයි—

යෙනඝැරදක්වනලද“මාඝඵාල්ගුනයෝර්මධ්‍ය කෘෂ්ණ පක්ෂ චතුර්දශී” යනාදි ශ්ලෝකයෙහිද දක්වනලද මාඝමාසය නොහොත්, නවන්මාසය යෙදෙන අයුරු පෙන්වනු පිණිස ටීකාකාරාචාර්‍ය්‍යවරයා විසින් “අත කථිත මාඝසංඥස්‍ය චාන්ද්‍රමාසස්‍යාත් සතු කුම්භරවෞ සෞරමාසෙ දර්ශාවසානො නවනීතඵොත්තම්”—

“මෙෂාදිසංස්ථෙ සවිතරි යො යො දර්ශඃ ප්‍රවර්තතෙ
චාන්ද්‍රමාසාස්තදන්තාඃ චෛත්‍රාද්‍යා ද්වාදශස්මෘතාඃ”

මෙහි කියනලද මාඝනම්වූ මාසය නොහොත් නවන්මස චාන්ද්‍රමාසය බැවින් හෙතෙම වනාහි කුම්භරවි සූර්‍ය්‍යමාසයෙහි අමාවක අවසන්කොට ඇති වේ- එසේ කියනලදී—හිරු මේෂය ආදි රාසිවලැ සිටිනකල්හි යම් යම් අමාවකක් පවතීද ඒ ඒ අමාවක අන්තවූ චෛත්‍රමාසය නොහොත් බක්මාසය ආදිවූ චාන්ද්‍රමාස දොළසක් දන්නා ලද්දාහුයි—මෙසේ ක්‍රමයෙන් සූර්‍ය්‍ය මේෂරාශිස සිටියදී වන අමාවකින් බක්මස කෙළවර වෙන බවද වෘෂභරාශිස සිටියදී වන අමාවකින් වෙසක් මස කෙළවර වෙනබවද මේ ක්‍රමයෙන් ඒ ඒ සූර්‍ය්‍යමාස යේදී වන අමාවකින් ඒ ඒ නම් ඇති මාස කෙළවර වෙනබව පැනේ—සමහර කෙනෙක්, හිරු මේෂයෙහි සිටියදී වන අමාවක ගිය පැළවියෙන් බක්මස ලබායයි කියත්, ඒ පූර්වාචාර්‍ය්‍ය වචනවලට විරුද්ධහෙයින් නොගත යුතුයි—යම් කාලෙක මෙෂරවියේ වන අමාවකලැබේද ඒ අමාවකට අනතුරු පැළවිය පටන් ඊලඟ අමාවක දක්වා වෙසක්මාසයයි—මෙසේ චාන්ද්‍රමාසයන් කාලවිධාන ටීකාදියෙහි කියනලද පිළිවෙළින්ම යෙදෙනබව ලිත්වලින් බලා ඒ ඒ මාසවල පව් නක්ෂත්‍ර වලින්ද සැකහැරගන්ට පුළුවන—මේ ක්‍රමයෙන් යෙදුන කල්හි මීනරවියෙහි වන අමාවකින් ඵාල්ගුන මාසය කෙළවර වීමෙන් බක්මස මීනරවියේදීම ලබනබව පෙනෙන්නේයි—මේෂ රවියේදී පූරපැළවියෙන් බක්මාසය ලබන්නේය යන කිම විශ්වාස කරන්ට පුළුවන්වූ පූර්වාචාර්‍ය්‍යවචනයක් නුදුටිමු—අවපැළවිය පටන් පුර පසළොස්වකදක්වා මාසයකැයි ව්‍යවහාරකරණලද මාසයෝ මෙසේ වෙත්—මීනරවියේ යෙදෙන මැදින්දින අමාවකට අනතුරුව මීනරවියේම හෝ මේෂ රවියේහෝ වන පෞර්ණමාසිය චෛත්‍රී, නොහොත් බක්මස පුර පසළොස්වකයි, ඒ පෞර්ණමාසියෙන් චාන්ද්‍රමාස ක්‍රමයෙන්වන බක්මස අවසන්වේ—ඒ ලඟ මේෂ රවියේ යෙදෙන බක් අමාවකට අනතුරුව යෙදෙන

පෞර්ණමාසිය වෛශාඛ පෞර්ණමාසියයි—මේ ආදී ක්‍රමයෙන්
කුම්භයෙහි හිරුසිටියදී යෙදෙන අමාවකට අනතුරුව යෙදෙ
න පෞර්ණමාසිය ඵාල්ගුනී පෞර්ණමාසියයි—මෙකියනලද මා
සයන්ගේ නම් ලැබෙන්නේ නකත් වශයෙන්ය—එනම්—"චි
ත්තාය නක්ඛත්තෙන පුණ්ණචන්දයුත්තාය යුත්තො මාසො
චිත්තො"–*–පුන්සඳින් යුත් සිත්නකතින් යුක්තවූ මාසයතෙ
ම චිත්තනම් වේ–බක්මසයි—"විසාඛාය නක්ඛත්තාය පුණ්ණ
චන්දයුත්තාය යුත්තො මාසො වෙසාඛො" පුන්සඳින් යුත් විසා
නකතින් යුත් මාසයතෙම වෙසාඛනම්වේ—වෙසක්මසයි—
මේ පිළිවෙළින් දතයුතු—මෙසෙ බක්මස ආදි මාසදෙළොස්
පෞර්ණමාසි දෙළසට යෙදෙන නකත් දෙළස—සිත, විසා,
දෙට, පුවසළ, සුවණ, පුවපුටුප, අස්විද, කැති, මුවසිරිස, පුස, මා,
උතුරුසළ, යන මොහුයි—එසේ යෙදෙන නකත් සමහරවිට
චන්ද්‍ර සූර්‍ය්‍යයන්ගේ ගමන් ශීඝ්‍රමන්දතාවයෙන් වෙනස්ව ගියක
ලැ ඊලඟ අන්නැකත්හු යෙදෙත්—එලෙස යෙදීමනිසා ඒ ඒ
පෞර්ණමාසිවලට යෙදෙනලෙස නියම කරණලද පිළිවෙළ
මෙසේයි–වේද ජ්‍යොතිෂයෙහි "තුලාදිං කත්තික රොහිණීවයං
ආදිං කත්වා කුම්භ සිංහෙ කඤ්ඤායඤ්ච තීනි තීනි නක්ඛත්තා
නි සෙසරාසිසු වෙ වෙ නක්ඛත්තානි ලිඛෙත්වා රාජමත්තණ්ඩ
ජ්‍යොතිත්තන්තාදිසු මාසසඤ්ඤං දසෙසන්ති"—තුලායෙහි කැති
රෙහෙණ දෙක ආදිකොට කුම්භයෙහිද සිංහයෙහිද කන්‍යාවේ
ද නකත් තුන තුනද සෙසු රාසිවලැ නකත් දෙකදෙකද ලි
යා රාජමාත්තණ්ඩ ජ්‍යොතිස්තත්ත්වාදියෙහි මාසසංඥාව දක්වා—
මෙහි තුලාවේයයි කීවේ එහි යෙදෙන ඉල් පුර පසළොස්ව
ක දස්වනපිණිසයි—ඉල්පුර පසළොස්වක යෙදෙන්නේ තුලා
රවියේ යෙදෙන අමාවකට අනතුරුවයි—ඒ තුලාරවියෙනුත්
වෘශ්චික රවියෙනුත් ලැබෙන කාර්ත්තික ක්ෂෙත්‍රය තුලයි—ඒ
තුලාරවියේම හෝ වේවා වෘශ්චිකරවියේ හෝ වේවා කාර්ත්ති
ක ක්ෂෙත්‍රය තුලමය—ඇතම් කාලෙක තුලා රවියේම වේ—
අන් කාලෙක වෘශ්චික රවියේ වේ—ඒ ශුක්ල පක්ෂයාගේ ආර
ම්භය තුලා රවියේමයි—එබැවින් ආරම්භය බලාගෙන තුලා
රාශි චාන්ද්‍රමාසයාගේ මධ්‍යයට පෞර්ණ මාසිය පැමිණෙන නි
සාත් තුලාවේයයි ආචාර්‍ය්‍යවරයන් විසින් කියනලදී—ඒ පෞ
ර්ණ මාසියට යෙදෙන්නේ කැති රෙහෙණ යන නකත් දෙ

---

* සූර්‍ය්‍යසිද්ධාන්ත ටීකා වෙහි—"චිත්‍රා සම්බන්ධා චෛත්‍රඃ—
විශාඛා සම්බන්ධා වෛශාඛඃ"–සිත සම්බන්ධ යෙන් චෛත්‍රය–
විශාඛනකත සම්බන්ධයෙන් වෛශාඛය යනාදීන් කියනලදී—

කැටි—කිසි කාලෙක බෙරණයත් යෙදෙනබව සමහර පණ්ඩිතයන් විසින් කියනලදි—

“යදාහි ඛො පුණ්ණචන්දො, කත්තිකම්භරණිම්පිවා
භජත්‍යථ වස්සානස්ස අන්තිමා චාතු මාසිනී
හොති සා පුණ්ණමී තස්සා පරං හෙමන්තිකා උතු.”

ඉක්බිති යම් කාලෙක්හි වනාහි පූර්ණචන්ද්‍රතෙම කැති නකත හෝ බෙරණය හෝ භජනය කෙරේද ඒ පෞර්ණමාසි තොමෝ වස්සානයාගේ අන්තිම චාතුමාසිනී වේ—එයින් මතු හේමන්තික ඍතුව වේ—උඳුවප් පෞර්ණ මාසියට, මුවසිරිස, අද—දුරුතු පෞර්ණමාසියට, පුනාවස, පුස—නවම් පෞර්ණමාසියට, අස්ලිස, මානකත්—මැදින පෞර්ණමාසියට, පුවපල්, උතුරුපල්ගුන, හත—බක් පෞර්ණ මාසියට, සිත, සා, වෙත්—කිසි කාලෙක බක්මස පෞර්ණමාසියට, හතයද වේයයි ඇතම් ආචාර්‍ය්‍ය කෙනෙක් කියත්—වෙසක් පෞර්ණ මාසියට, විසා, අනුර, දෙකයි, ඇතම් කාලෙක සා නකතද වේ—පොසොන් පෞර්ණ මාසියට, දෙට, මුල—ඇසළ පෞර්ණමාසියට, පුවසළ, උතුරුසළ—නිකිණි පෞර්ණමාසියට, සුවණ, දෙනට—බිනර පෞර්ණ මාසියට, සියාවස, පුවපුටුප, උතුරු පුටුප—වප්මස පෞර්ණ මාසියට, රේවතී, අස්විද, බෙරණ, යනමේ ක්‍රමයෙන් වෙත්—*—මෙහි අන්තිම කියනලද බෙරණය වප් පෞර්ණ මාසියටද ඉල්පෞර්ණ මාසියටද සමානයි—

මේ, ඒ ඒ පෞර්ණ මාසිවලට යෙදෙන නක්ෂත්‍රයන්ගේ ක්‍රම යයි—ඒ ඒ පෞර්ණ මාසීහු කොයි කොයි තැන්හි යෙදෙත්ද යත්—වේද විනිශ්චයෙහි—

“ආදිකප්පම්හි කුම්භරාසියං චතුවීසති නක්ඛත්ත එකපාද පණ්ණරස චන්දමාසංස දිනෙ නක්ඛත්ත සූරිය චන්දිමානං පාතුභාවතො පට්ඨාය නාඩිදින කමෙන අගතෙ මීනරාසියං පඤ්චවීසති නක්ඛත්ත එකපාද නාඩි සතෙ තිංස චන්දමාසංස දිනෙ පඨම පතෙඩා හොති”—ආදි කල්පයෙහි කුම්භරාසි යෙහි සූවිසි නකත් එකපාද පසළොස්වන චන්ද්‍රමාසාංශ දිනයෙහි නක්ෂත්‍ර සූර්‍ය්‍ය චන්ද්‍රයන්ගේ පහළවීමපටන් නාඩි දවස් ක්‍රම

---

* සූර්‍ය්‍ය සිද්ධාන්ත යෙහි—
“කාර්ත්තිකාදිෂු සංයොගෙ කෘත්තිකාදි ද්වයං ද්වයං,
අන්ත්‍යොපාන්ත්‍යෞ පඤ්චමශ්ච ත්‍රිධා මාසත්‍රයං ස්මෘතම්
යි—එසේම කියන ලදි—

යෙන් ආකල්හි, මීන රාසියෙහි පස්වීසි නකත් එකපාද නාඩි
සියක්වූ තිස්වෙනි චාන්‍ද්‍රමාසාංශකයෙහි ප්‍රථම පක්‍ෂයෙව්—
මෙහි කුම්භයෙහි සූවිසි නකත් එක්පාදය යන්නු, පූවපුටුපෙ
නකතෙන් ප්‍රථම පාදයට හිරු පැමිනීමයි— අස්විදය පටන්
ගැණ බලා දතයුතුයි—පසළොස්වන චාන්‍ද්‍රමාසාංශ දිනයෙහි
යන්නු, ඵාල්ගුන මාසයාගේ පසළොස්වන අංශකවූ පෞර්ණ
මාසී දිනයි—

තවද, කුම්භරවියේදී ඵාල්ගුන චාන්‍ද්‍රමාසය ලබන හෙයින්ද
ඒ ලබන දින චන්‍ද්‍රයා කුම්භරාශියෙහි සිටින බැවින්ද, මීනරවි
යෙහිත් ඵාල්ගුන පෞර්ණ මාසිය යෙදුන නුමුත් කුම්භරාසි
යෙහි මැදින පෞර්ණ මාසිය වෙයි යන්නු අවිරුඬයයි දතයුතු—
ඇතම් කෙනෙක්, මැදින්දින පෞර්ණමාසී දිනයෙහි මේෂ
රාසියෙන් හිරු උදාවේ යයි කියත්—පූවපල් උතුරුපල් යන
නකතකින් යෙදෙන මැදින්දින පෞර්ණ මාසි දිනක කුම්භ
මීන දෙකෙන් පිටත් රාශියකින් හිරුගේ උදාවක් කිසි කා
ලෙක නැත්තේය, එබැවින් එකීම කිසි පරිද්දෙකින් නොගත
යුතු—විශුඬිමාර්ග යෙහි "තෙව බො අපුබ්බං අචරිමං ඵග්ගු
න පුණ්ණම් දිවසෙ යෙව පාතු භවන්ති වෙදිතබ්බං" ඒ
මෙරු චක්‍රවාට හිමවත් චන්‍ද්‍ර සූර්‍ය්‍ය නක්‍ෂත්‍ර තාරකාදීහුද චනා
හි පෙර පසු නොව ඵාල්ගුන පෞර්ණමාසී දිනදීම පහළවෙත්
යයි දතයුතු—ඵාල්ගුන පෞර්ණ මාසිය වන්නේනම් "ඵග්ගු
නෙන නක්ඛත්තෙන යුත්තා පුණ්ණමී ඵග්ගුනී" ඵාල්ගුන න
කතින් යුක්තවූ පෞර්ණමාසි තොමෝ ඵග්ගුනී නම්—මෙසේ
යි—එහෙයින් පූවපල් උතුරුපල් නකත් දෙකෙන් එකකින්
චන්‍ද්‍රයා උදාවූනාට අනුමාන නැත "තස්මිං ඛණෙ උත්තර ඵග්ගු
න නක්ඛත්තෙන සඬිං චන්දමණ්ඩලං උප්පජ්ජි" එකණෙහි උතු
රුපල්ගුන නකතහා සමග සඳමඩල උපන්නේයයි, ජිනාලං
කාරයෙහි කියන ලදී—උතුරුපල්ගුන නකතහා සමග
චන්‍ද්‍රයා උදාවූවත්, සූර්‍ය්‍යා කුම්භ රාශ්‍යන්ත යෙහි සිටිය යුතුය—
එහෙයින් ඊලඟ අමාවක යෙදෙන්නේ මීනරවියේ දීය—
එබැවින් වෛදම්නිශව යෙහි උතුරුපුටුපයෙන් එකපාද නාඩි
සියයක් සූර්‍ය්‍යා ගියකල්හි තිස්වන චාන්‍ද්‍ර මාසාංශක යෙහි ප්‍රථම
පක්‍ෂය වෙයි කියන ලදී—එබැවින් මීන රවියෙහි යෙදෙන
අමාවකට අනතුරු පෞර්ණමාසිය චෛත්‍ර පෞර්ණ මාසිනම්—
නොහොත් බක්මස පුර පසළොස්වකයි—මේෂ රවියෙහි
වන අමාවකට අනතුරුවැ වන පෞර්ණ මාසිය වෛසාඛ
නම්—වෘෂභරවියෙහි වන අමාවකට අනතුරුව වන පෞ

ර්ණමාසිය ජ්‍යෛෂ්ඨී නම්වේ—මිථුන රවියෙහි වන අමාවක ට අනතුරුවැ වන පෞර්ණමාසි තොමෝ ආෂාඪී නම්වේ—කටකරවියෙහි වන අමාවකට අනතුරුවැ වන පෞර්ණමාසිය ශ්‍රාවණී නම්වේ—ඒබව මෙයින් දත්නේය—

"ශ්‍රවණ නක්ෂත්‍ර යුක්තා පෞර්ණමාසී ශ්‍රාවණී සාච කථිතා සෙයං සවිතරි අමාවස්‍යානන්තරප්‍රාප්තා පෞර්ණමාසී භවති, සා ශ්‍රාවණ ශ්‍රවිෂ්ඨා නක්ෂත්‍රයොරන්‍යතරෙණ යුජ්‍යතෙ, රවෞ සිංහගතෙ දශ්‍රානන්තරගතා පෞර්ණමාසී ශතභිෂක්ප්‍රොෂ්ඨපද යොව්‍යාප්‍යතෙ සා ප්‍රෞෂ්ඨපදී"—

සුවණ නකතින් යුක්පෞර්ණමාසි තොමෝ ශ්‍රාවණී නම්වේ. ඕතොමෝද හිරු කටකයෙහි සිටිකල්හි යෙදෙන අමාවකට අනතුරුව පැමිණි පෞර්ණමාසිය වෙයි, ඕතොමෝ සුවණ දෙනට නකත් දෙකින් එකකින් යෙදේ හිරු සිංහයට ගියකල්හි වන අමාවකට අනතුරුව ගියාවූ පෞර්ණමාසි තොමෝ සියාවස පුවපුටුප දෙකෙන් හෝ යෙදෙයි, ඕතොමෝ ප්‍රෞෂ්ඨපදීනම්—නොහොත් බිනර පුරපසළොස්වකයි—එබැවින් සිංහ රවියෙහි වන අමාවකට අනතුරුව වන පෞර්ණමාසිය ප්‍රෞෂ්ඨපදී නම්—කන්‍යා රවියෙහි වන අමාවකට අනතුරුව යෙදෙන පෞර්ණමාසිය අශ්වයුක් නම්—තුලාරවියෙහි වන අමාවකට අනතුරුව වන පෞර්ණමාසි තොමෝ කාර්ත්තිකී නම්—මෙතැන්හි ඇතම් කෙනෙක් කාර්ත්තික පෞර්ණමාසිය වෘශ්චික රවියෙහිම යෙදිය යුතුයයි කියත්—ඒ කියන්නේනම්—

"වෘශ්චිකසෙථ දිවානාථෙ සප්තමසෙථ නිශාකරෙ
කෘත්තිකා ධිෂ්ණ්‍යසංයොගෙ රාත්‍රෞ දීපාන් ප්‍රරොපයෙත්"

හිරු වෘශ්චිකයෙහි සිටිකලැ චන්ද්‍රයා සත්වන්නේ සිටිකල්හි කැතිනකතගේ යෙදීමෙහි කෘත්තිකා පූජා පිණිස පහන් දල්වන්නේයි—යනමෙහි කෘත්තිකා පහන් පූජාවේ යොගය ලෙසටම ඉල්පුර පසළොස්වක යෙදිය යුතුය යන කල්පනා වෙන්ය—මේ කීවේ කෘත්තිකා පහන්පූජාවේ උතුම් යෝග යයි—එසේ නැතත් පහන් පූජාව කරන්ට යුතුසැටි ආචාර්‍ය්‍ය භාරද්වාජයන් විසින් මෙසේ කියනලදී—

"මාසාද්‍ය කෘත්තිකාසෙච
සංක්‍රාන්තිං ඥානාඥ සංත්‍යජෙත්"

ඉල්මසින් සම් පෞර්ණමාසියන් තොමෝ කැති නකත් හිමිවේ එහි සංක්‍රාන්තිය හරනේයි—

ජ්‍යොතී ෂාර්ණව යෙහිද—

"කෘත්තිකාපච් සංයුක්තමුත්තමං දීපමාචරෙත්
තත්පාශ්වෙ පච්සංයුක්තං මධ්‍යමං දීපමාචරෙත්
කෘත්තිකාභිරයොගෙ වා කෙවලායාං තිථෞ භවෙත්"

කැතිනකත්හා පක්ෂාන්ත තිථිය යෙදුනේ නම් උතුම් පහන් පූජාව කරන්නේයි—එහි පාශ්වයෙක්හි පක්ෂාන්ත තිථිය යෙදුනේ නම් මධ්‍යම පහන් පූජාව කරන්නේයි— කැතිනකතින් නොයෙදීමෙන් හෝ කෙවල තිථියෙහිද පහන් පූජාව වන්නේයි යනු භාවයි— මේ ආදී නොයෙක් ප්‍රකාර වලින් ඒ පහන් පූජාව කටයුතුබැව් කියා තිබෙන හෙයින් වෘශ්චිකයේ හිරු සිටියදී කැතිනකතින්පුන් පුර පසළොස්වක යෙදුනේනම් ඒ පහන් පිදීමට යහපත් යොගයෙක යනු හැගෙන්නේ විනමුත් ඒසේම වස්සානය කෙළවර කරණ පෞර්ණමාසිය යෙදිය යුතුය යනු නොහැනේ— ඒනම් "තුලාසෙථ රවෞ යා පෞර්ණමාසී සා කාර්තිකී" යනාදි අවාක්‍යවචන තිබෙන හෙයිනි—එත් තුලාරවියේදී වන අමාවකට අනතුරු පෞර්ණමාසිය තුලාරවියේම හෝ වෙවා වෘශ්චික රවියේහෝ වෙවා තුලාරවියෙන් ඒ පූර්ණපක්ෂය පටන් ගන්නා හෙයින් එසේ කියනලදැයි දතයුතු-වෘශ්චිකයෙහි හිරු සිටියදී වන අමාවකට අනතුරුව වෘශ්චික රවියේහෝ ධනුරවියේහෝ වන පෞර්ණමාසිය මාගශීර්ෂීනම්—ධනු රවියේදී වන අමාවකින් අනතුරුව ධනු රවියේ හෝ මකර රවියේහෝ වන් පෞර්ණමාසිය පෞෂ පෞර්ණ මාසී නම්-මකර රවියේදී වන අමාවකින් අනතුරුව මකර රවියේමහෝ කුම්භ රවියේ හෝ වන පෞර්ණ මාසී නොහොත් මාඝ පෞර්ණ මාසී නම්—එහෙයින් කියන ලදී රාජමාර්තණ්ඩ යෙහි—"මාඝඵවනු මාඝීසාත් මකරෙශ් දිවාකරෙ"යි—මේ මාස ක්‍රමය මූල කී පූර පැළවියෙන් ලබන මාස ක්‍රමයාගේ අවබොධ වීමෙන්ම හැගෙන බව මෙසෙයින් දන්නේයි—මීනයේ හිරු සිටියදී වන අමාවකින් එළඹෙන චාන්ද්‍ර මාසය අවසන්නම් එතැනින් ලබන්නේ චෛත්‍ර මාසය බවද අනතුරු පෞර්ණ මාසිය චෛත්‍ර පෞර්ණ මාසිය බවද හැගේමැයි— හැමු කල්හිම බක්මස පෞර්ණ මාසිය පූර පැළවියෙන් ලබන රාශි මාස සංඛ්‍යාත චාන්ද්‍රමාස ක්‍රමයෙන්ද, අව පැළවියෙන් ලබන සෘතු මාස සාංඛ්‍යාත චාන්ද්‍රමාස ක්‍රමයෙන්ද, එකම චෛත්‍රය යන -නාමය ලබන්නේය— හෙද මීන රවි

යේ හෝ මේෂ රවියෙදී හෝයි—මීනරවියේ යෙදෙන අමාවක රාශි මාස සංඛ්‍යාත චාන්ද්‍රමාස ක්‍රමයෙන් මැදින්දින අමාවකයයි කියාද, සෞර මාස සංඛ්‍යාත චාන්ද්‍රමාසයෙන් බක්මස අමාවකයයි කියාද, නම් දෙකක් ලබන්නේය—මෙසින් බක් වෙසක් යනාදී චාන්ද්‍රමාස නාමයන්ගේ ව්‍යවහාරය පූරාණ පොත්වල පෙනෙන්නේ පූර පැලවියෙන් ලබන චාන්ද්‍රමාස පිළිවෙළින්ය—අව පැළවියෙන් ලබන මාස පිළිවෙළේ ව්‍යවහාරය පෙනෙන්නේ සෞර ක්‍රමයෙන් සෞරවේ පළමුවෙනි දෙවෙනි ආදී ගණන් ක්‍රමයෙන්ය—ඒ බැව් මෙසෙයින් දන්නේය—

විනයාර්ථ මංජූසා යෙහි—

"ගිම්හානං පච්ඡිමස්ස මාසස්ස පඨම දිවසතො පට්ඨායාති, එත්ථ ජෙට්ඨමූල කාලපක්ඛුපොසථ පච්ඡිම පාටිපද දිවසතො පට්ඨාය යාව ආසාළ්හි පුණ්ණමා යදස්ස අඩ්ඪමාසො ගිම්හානං පච්ඡිමමාසො නාම, තස්ස පඨමදිවසතො පට්ඨායාති අත්ථො"

ග්‍රීෂ්මමාසයන් සම්බන්ධවූ පශ්චිම අර්ධමාසයාගේ පළමුවෙනි දවස පටන්ය යන මෙහි පොසොන් කාලපක්ෂයට පසු පැළවිය දවසපටන් ඇසල පෞර්ණමාසිය දක්වා යම් අර්ධමාසයක් වේද හෙතෙම ග්‍රීෂ්ම මාසයන් සම්බන්ධවූ පශ්චිමාර්ධ මාසය නම්වේ, ඒ අර්ධමාසයාගේ පළමු වෙනි දවස පටන්ය යන අර්ථයි—මෙහි කී ගිම්හාන සෘතුවේ අන්තිම අර්ධමාසය ලබන්ට මත්තෙන් යෙදෙන අමාවක සෞර මාස පිළිවෙළින් ඇසළයමයි—එසේත් පොසොන් කාලපක්ෂයෙහි පොහොයයි කියා තිබෙන්නේ පූර පැලවියෙන් ලබන චාන්ද්‍රමාස පිළිවෙළින්ය—එසේද වූවත් පාටලී පුත්‍රාදී සමහර රටවල ඇතම් කාලවලදී අව පැලවියෙන් ලබන මාස පිළිවෙළිනුත් මාස ව්‍යවහාර කරණ බව සාරාර්ථ දීපනී ආදියෙන් පෙනේ—

තවද මේ පෞර්ණමාසී දොළස යෙදීමට ක්ෂෙත්‍ර දොළසක් වේ, ඒ බැව් සියම්රට වාසී පණ්ඩිතයන් විසින් මෙසේ දක්වනලදී—

"ධනුම්හෙ කූනවීසංසා රවිසංගමනෙ යද,
තතො පට්ඨාය යෙ හොන්ති දිවසා සමතිංසති
එතං තිංස දිවසිකං ඵුස්ස ඛෙත්තං පවුච්චති"

යම් දිනක ධනුරාශියෙහි එකූන්විසි වන අංශකයට හිරු පැමිණේද, එතැන් පටන් යම් සමතිස් දිනක් වේද මේ තිස් දවසක් ඇතිසේ පෞෂ ක්ෂෙත්‍ර නම්වේ, හෙවත් දුරුතු පූර

පසළොස්වක ගෙදිමට සෙපතු නම් වේ—මකරයෙහි එකුන් විසි භාගය පටන් එකුන් තිස් දිනක් හෝ ඇතම් කලෙක සම තිස් දිනක් හෝ නවත් පූර පසළොස්වකට කෙතයි—මේ ක්‍රම යෙන් සෙසු දසමාසයන්ටද සෙපතු දශයක් වේ—මේක්‍රම යෙන් ඒරෝපා රටවාසී ආදීන් විසින් මාස ක්‍රමයක් පවත්වනු ලැබේ—සූර්‍ය්‍ය මාස ක්‍රමය සංක්‍රම වශයෙන් ප්‍රකටයි.

මෙයින් මතු සෘතු විභාගය දක්වනු ලැබේ—

---

"ද්වෞ ද්වෞ මාඝාදි මාසෞස්‍යා දෘතුස්තෛරයනාන්ත්‍රිභිඃ,
අයනෙ ද්වෙ ගති රුදගදක්ෂිණාර්කස්‍ය වත්සරඃ"

යනු හෙයින් මාඝ මාසය හෙවත් නවත්මස ආදිවූ මාස දෙකක් එක සෘතුව බැගින් සෘතු තුනකින් එක් අයනයයි, සූර්‍ය්‍යාගේ උත්තර දක්ෂිණ සංඛ්‍යාත අයන දෙකක් අවුරුද්දෙක් නම් වේ—මෙහි නවම්මස ආදි මාඝ දෙක බැගින් සෘතු සයකි, එනම්— නවම් මැදින් දෙමස සිසිර නම්—බක් වෙසක් දෙමස වසන්ත නම්—පොසොන් ඇසළ දෙමස ග්‍රීෂ්ම නම්—නිකිනි බිනර දෙමස වර්‍ෂා නම්—වප් ඉල් දෙමස ශරත් නම්—උඳුවප් දුරුතු දෙමස හෙමන්ත නම්—එහෙයින් කියන ලදී සුශ්‍රුත යෙහි—

තපස්තපස්‍යෞ ශිශිරඃ,
මධු මාධවෞ වසන්තඃ,
ශුචි ශුක්‍රෞ ග්‍රීෂ්මඃ,
නභෝනභස්‍යෞ වර්‍ෂා,
ඉෂෝර්ජෞ ශරත්,
සහඃසහස්‍යෞ හෙමන්තඃ යි.

පාලි නිඝණ්ඩු යෙහි—

"හෙමන්තො සිසිරමුතු ඡවා වසන්තොච ගිම්හ වස්සානා
සරදොති කමා මාසා ද්වෙ ද්වෙ වුත්තානුසාරෙන"

මෙහි හෙමන්ත සෘතුව මූලට කියන ලදී—

"වසන්තග්‍රීෂ්ම වර්‍ෂාශ්ච" යනාදීන් දෛවඥ මුඛමණ්ඩන යෙහි වසන්ත සෘතුව මූලට දක්වන ලදී--මේ සෘතු සය වස්සානාදි චාතුර්මාස්‍ය විධියෙන් සෘතු තුනක් වේ—එ බැව් මණිමුක්තා වලි යෙහි—"ත්‍ර්‍යෘතුඃ සංවත්සර ඉත්‍යෙය තනමතාශ්‍රයනෙන චාතුර්මාස්‍යවත්වාරෙ මාසා සාත වසන්තදනෙත ධවරෙර්‍ෂාචාතුර්මා සා ධෛ‍්‍යර්‍ය්‍යා ගෛශ්‍යු ජෙත"

මඤ්ජුසංගීතාවෙහි—

“යතක්ඛුවිනවම්ඵුනා මිශ්‍රං පුදදුහනතු ත්‍රයොදශිං
තදපාඃක්ෂය මෙවසහන් වර්ෂාසූව මඝාසූච”

මඤ්ජුමිශ්‍ර කාරණලද යම් කිසිවක් වර්ෂාකාල යෙහි මානකත්‍රැති තෙළෙස්වක්හි දෙන්නේද එද වනාහි අක්ෂය වන්නේයි—ම්ට ටීකා මඤ්ජුශ්‍රී මුක්තාවලි යෙහි, ගංගාතීර වාසීවූ බාරෙනැනාඤන වාසීය භට්ට දිවාකරාත්මජ ශ්‍රී කුලලූක භට්ටාචාර්යෙශ්වරයාවිසින් “වර්ෂාකාලෙ මඝා ත්‍රයොදශ්‍යාං”යි වර්ෂා කාලයෙහි මානකතින් යුත් තෙළෙස්වක්හිය කියාද-“තත්‍රාපි ප්‍රොෂ්ඨ පදාඛමහිතායාං මඝායුක්තායාං ත්‍රයොදශිං ප්‍රාප්‍ය ශ්‍රාද්ධංහි කර්තව්‍යාං”-

එහිදු බිනර පුර පසළොස්වක ඉක්මුනු කල්හි මානකතින් යුත් තෙළෙස්වකට පැමිණ ශ්‍රාද්ධවිධිය කටයුතුමැයි කියාද. කෘෂ්ණ ත්‍රයොදශි පූර්වතො ගච ගෲහෘතෙයි—බිනර කළුවර තෙළෙස්වක පෙරද මෙහිද ගන්නා ලැබෙයි කියනලදී—එබැවින් වස්සාන ඍතුවෙහි පස්වෙනි කළුවර පක්ෂයෙහි තෙළෙස්වකට මානකත යෙදෙන බවද ඒ පක්ෂය පුර පැළවියෙන් ලබනමාස ක්‍රමයෙන් බිනරමස අපරාර්ධය බවද දතයුතු-

වප්මස පුර පසළොස්වක ගිය අව පැළවිය පටන් ඉල්මස පුර පැළවියට වස්සාන ඍතුවේ සතර වෙනි මාසය වෙයි—

මේ ප්‍රකෘතියෙන් ඍතු යෙදෙන ක්‍රමයයි—

මෙම තුන් ඍතුවෙහිම එක ඍතුවක චාතුද්දසී පෝය දෙකක්ද පණ්ණරසී පෝය හයක්ද වේ—ඍතුවෙහි තුන්වෙනි සත්වෙනි පෝය දෙක චාතුද්දසීයි-සෙසු පොහෝ පණ්ණරසියි-හේමන්ත ඍතුවේ තුන්වෙනි චාතුද්දසිය පුර පැළවියෙන් ලබන චාන්ද්‍රමාස ක්‍රමයෙන් උඳුවප් මස කාලපක්ෂ යෙහිද සත්වෙනි චාතුද්දසිය නවම්මස කාලපක්ෂ යෙහිද, ගිම්හාන ඍතුවේ තුන්වෙනි චාතුද්දසිය බක්මස කාලපක්ෂයෙහි ද, සත්වෙනි චාතුද්දසිය පොසොන්මස කාලපක්ෂ යෙහිද, වස්සාන ඍතුවේ තුන්වෙනි චාතුද්දසිය නිකිනි කාලපක්ෂ යෙහිද, සත්වෙනි චාතුද්දසිය වප් මස කාලපක්ෂ යෙහිද, කටයුතුයි—එහෙයින් කියනලදී විනයාලංකාරයෙහි—

“තත්‍ථ හෙමන්තස්ස උතුනො මාගසිර මාසස්ස කාලපක්ඛො මාඝමාසස්ස කාලපක්ඛචාති අඩ්ඪො—ගිම්හස්ස උතුනො තනියෙ චිත්තමාසස්ස කාලපක්ඛො සතනමෙ ජෙට්ඨමාසස්ස කාලපක්ඛො වස්සානස්ස උතුනො තතියෙ සාවණ මාසස්ස කාල පක්ඛො සත්තමෙ අස්සයුජ මාසස්ස කාලපක්ඛචාති

අෂාඪ"යි—මෙහි කියනලද නාමයෝ පූර පැළපියෙන් ලබන මාසක්‍රමයෙනැයි දතයුතු-මෙයින් වස්සාන ඍතුවෙහි භික්ෂූන්ගේ වස්එළඹීම පෙර පසු වසයෙන් දෙවැදෑරුම් වේ—එබැවී, සර්වඥයන් වහන්සේ විසින් මෙසේ වදාරණ ලදී—

"මෙමා භික්ඛවෙ වස්සූපනායිකා පුරිමිකා පච්ඡිමිකාච අපරජ්ජු ගතාය ආසාළ්හියා පුරිමිකා උපගන්තබ්බා මාස ගතාය ආසාළ්හියා පච්ඡිමිකා උපගන්තබ්බා"

මහණෙනි පෙරය පසුදැයි මේ වස්එළඹීම් දෙකෙක් වේ, ඇසළ පෞර්ණමාසිය ගිය දෙවැනි දවස්හි පෙරවස් එළඹිය යුතුයි, ඇසළ පෞර්ණමාසිය ගොස් මාසයක් ගියකල්හි පසුවස් එළඹිය යුතුයි—යනු භාවයි

මෙහි කී පෙරවස් පසුවස් එළඹෙන දවස් දැනගන්නේ මෙසේයි—යම් කලෙක මිථුන රවියේ වන අමාවකට අනතුරුවන පෞර්ණමාසිය මිථුන රවියේ හෝ කර්කට රවියේ හෝ පුවසළ උතුරුසළ දෙකින් එකකින් යෙදේද ඒ පෞර්ණමාසියේ කරණ පොහොයෙන් ගිම්හාන ඍතුව කෙළවර කොට අනතුරු පැළවිය දවස්හි පෙරවස් එළඹියයුතුයි—

ඉන්පසු නිකිනි පෞර්ණමාසියෙන් වස්සාන ඍතුවේ දෙවෙනිපොහොය කොට අනතුරු පැළවිය දවස්හි පසුවස් එළඹිය යුතුයි මේ ශාශනිකවූ විප්‍රකාර වස් එළඹීමෙන්ම එළඹ චාරිකාවේ නොහැසිර භික්ෂූන්ගේ විසීමේ නියමය තුන්මසක්මය—අනතරායන් නිසා ඇතම් කලෙක පෙර වස වැඩිවේ ඒ බැවී—"න භික්ඛවෙ වස්සං උපගන්ත්වා පුරිමංවා තෙ මාසං පච්ඡිමංවා තෙමාසං අවසිත්වා චාරිකා පක්කමිතබ්බා"යනාදින් දන්නේයි—බාහිරක තාපසයන්ට නියම කරණලද චාතුර්මාස්‍ය ව්‍රතයෙන් වස් එළඹ ගමින්ගම නොහැසිර විසීමට සාරමසක්ම වේ—එහෙයින් ඔවුන්ගේ පවාරණය වෙනස්වූයේ නමුත් ඇසළ පුර පසළොස්වක හෝ නිකිනි පූර පසළොස්වක හෝ පටන්ගැන්මේ ඉමට තබා වස් එළඹෙන හෙයින් එළඹීම බුදුන් වදාළ වස්එළඹීමට අවිරුද්ධම යයි දතයුතු, ඒ බැවී—"ආෂාඪීංවා ශ්‍රාවණීං පෞර්ණ මාසීං"—යනාදි කාලවිධාන පාඨාදි යෙන් දන්නේයි—කාල විධාන ටීකායෙහි, "මිථුනසේථ රවෞ යා පෞර්ණමාසී" යනාදියෙහි අර්ථ ගන්නා පරිදි මෙහි මීට පූර්වයෙන් කියන ලදී—

මෙසේ ප්‍රකෘතියෙන් වස් එළඹීම සංක්ෂේපයෙන් දක්වා ඉක්බිති අධිකමාස යුත් වර්ෂවල වස්එළඹෙන ක්‍රමය දක්වනු ලැබේ

සර්වඥයන් වහන්සේ විසින් වස්සූපනායිකාව අනුදැන වදාළායින් පසු අධිකමාසය හැර වස් එළඹීමට නැවත අනු ප්‍රඥප්තියක් වසයෙන් අවසර දී වදාළ සේක෴ එයින් ප්‍රථම කොට පනවා වදාළ වස්එළඹීමේ අනුදැනීම මෙහි විස්තර නොකළේ ග්‍රන්ථය මහත්වීම වලකනු පිණිසය෴ එබැවින් වස්එළඹෙන දවස් නියමකොට ඇත—අධික ඇරීමට අවසර දුන් සැටි මෙසේ දතයුතු෴

"තෙන ඛො පන සමයෙන රාජා මාගධො සෙනියො බිම්බිසාරො වස්සං උක්කඩ්ඪිතු කාමො භික්ඛූනං සන්තිකෙ දූතං පාහෙසි යදිපනය්‍යා ආගමෙ ජුණ්හෙ වස්සං උපගච්ඡෙය්‍යුන්ති, භගවතො එතමත්ථං ආරොචෙසුං, අනුජානාමි භික්ඛවෙ රාජූනං අනුවත්තිතුන්ති"—යම් සමයෙක්හි සර්වඥයන් වහන්සේ රජගහ නුවර වේළුවනයෙහි වැඩවසන සේක්ද, එසමයෙහි වනාහි මගධ රටට අධිපතිවූ සේනාඇති බිම්සර රජතෙම වස්සුක්කඩ්ඪනය කරණු කැමැත්තේ ඉදින් ස්වාමින්වහන්සේලා වර්තමාන පෞර්ණමාසිය හැර එන්නාවූ පෞර්ණමාසියෙහි වස්එළඹෙන්නාහු නම් මැනවැයි භික්ෂූන් සමීපයෙහි දූතයෙක් යැවූයේය—භික්ෂූන් වහන්සේලා සර්වඥයන් වහන්සේට ඒ කාරණය සැලකළාහුය, මහණෙනි රජුන්ට අනුව පවතින්ට අනුදනිමියි සර්වඥයන්වහන්සේ වදාළසේකි෴ වස්සුක්කඩ්ඪනයට මෙපමණක් අනුදැනිමයි—මෙහි වස්සුක්කඩ්ඪනය නම් වස නොහොත් වර්ෂය උඩට ඇදීමයි—එනම්—මාසයක් අධික ඇර වස්එළඹීමයි—අධික මාසයක් වන්නේනම් චන්ද්‍රසූර්‍ය්‍යයන් දෙදෙනාගේ ගමන් භෙදයෙන් තිපඅවුරුද්දකින් එක අවුරුද්දක චාන්ද්‍රමාසයක් වැඩිවෙන හෙයිනි—ඒ වැඩිවූ චාන්ද්‍රමාසය අධිකයට හැර සෘතුව ප්‍රකෘති කරගෙන වස්එළඹිය යුතුයි෴ වස්සුක්කඩ්ඪනය කරණපරිදි වස්සිකසාටිකා ශික්ෂාපද තදත්ථකථාදියෙනුත් හැඟේ—ඒ මෙසේයි—

"මාසො සෙසො ගිම්හානන්ති භික්ඛුනා වස්සික සාටිකචීවරං පරියෙසි තබ්බං අඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙ තබ්බං ඔරෙනචෙ මාසො සෙසො ගිම්හානන්ති වස්සිකසාටිකං පරියෙසෙය්‍ය ඔරෙනඩ්ඪමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙය්‍ය නිස්සග්ගියං පාචිත්තියං"෴ ග්‍රීෂ්ම මාසයන් අතුරෙන්, මාසයක් ඉතිරි වූයේයයි දැන භික්ෂුව විසින් වැසිසළු සිවුර සෙවිය යුතුයි—ග්‍රීෂ්ම මාසයන් අතුරෙන් අර්ධ මාසයක් ශෙෂවූයේයයි දැන වැසිසළුව කොට හැඳිය යුතුයි—ග්‍රීෂ්ම මාසයන් අතුරෙන්. මාසයක් ශෙෂවීමෙන් මෙපිට වැසි

සළු සිවුර සෙවූයේ වීනම්, අර්ධමාසයක් ශේෂවීමෙන් මෙපිට කොට ඇත්දේ වීනම්, නිසග්ගි පචිති වෙයි යනු භාවයි— පදභාජනී යෙහි-"පරිසිට්ඨාය වස්සික සාටිකාය වස්සා උක්කඩ්ඪියති නිවත්ථාය වස්සිකසාටිකාය වස්සං උක්කඩ්ඪියති, ධොවිත්වා නික්ඛිපි තබ්බා, සමයෙ නිවාසෙතබ්බා"— වැසිසළු සිවුර සෙවූ කල්හි වස්සුක්කඩ්ඪනය කරණලැබේද වැසිසළු සිවුර ඇන්ද කල්හි වස්සුක්කඩ්ඪනය කරණුලැබේද, සෝදා තැබිය යුතුයි-කාලයෙහි ඇන්දයුතුයි— අටුවායෙහි-"වස්සං උක්කඩ්ඪියතීති, එත්ථ සචෙ කතපරියෙසිතාය වස්සිකසාටිකාය ගිම්හානං පච්ඡිම මාසං ඛෙපෙත්වා, පුන වස්සානස්ස පඨමමාසං උක්කඩ්ඪිත්වා ගිම්හානං පච්ඡිමමාසමෙව කරොන්ති වස්සිකසාටිකා ධොවිත්වා නික්ඛිපි තබ්බා, අනධිට්ඨිතා අවිකප්පිතා මෙ මාසපරිහාරං ලභති, වස්සූපනායිකදිවසෙ අධිට්ඨාතබ්බා"— වස්සුක්කඩ්ඪනය කරණු ලැබෙයි යනමෙහි, ඉදින් වස්සික සාටිකාව සෙවූ කල්හි, ග්‍රීෂ්ම මාසයන් අතුරෙන් අන්තිම මාසය ශෙවා නැවත වස්සානයාගේ පළමුවෙනි මාසය උඩට ඇද ග්‍රීෂ්මමාසයන් සම්බන්ධවූ අන්තිම මාසයම කෙරෙත්ද, වැසිසළුව සෝදා තැබිය යුතුයි, නොසිටන ලද්දුවූ නොවිකපනලද්දුවූ දෙමසක් පරිහාර ලබයි, වස්එලඹෙන දවස්හි ඉටිය යුතුයි— මෙතැන්හි, උඩට අදිනු ලබන වස්සානයාගේ පළමුවෙනි මාසයනම්, සෘතුමාස ක්‍රමයෙන් ගණන් වශයෙන් නිකිනි මාසයද රාශිමාස සංඛ්‍යාත චාන්ද්‍රමාසක්‍රමයෙන් ඇසළ මාසයද වියයුතුය, නොහොත්, අධිකමාස දැක්වූ ශාසනික වෛදික පොත්වලැ පෙනෙන ලක්ෂණවශයෙන් කියනලද ඇසළ ඉදුකොත් ඇසළයෙකි—

"මාසො සෙසො ගිම්හානන්ති, චතුන්නං ගිම්හ මාසානං එකො පච්ඡිම මාසො සෙසො පරියෙසිතබ්බොන්ති, ගිම්හානං පච්ඡිම මාසස්ස පඨමදිවසතො පට්ඨාය"—

ග්‍රීෂ්ම මාසයන් අතුරෙන් මාසයක් ශේෂවූයේය යනු, ග්‍රීෂ්ම සතර මාසයන් අතුරෙන් එකපසුමස ඉතිරියි-සෙවිය යුතුයයනු ග්‍රීෂ්ම මාසයන් අතුරෙන් පශ්චිම මාසයාගේ පළමුවෙනි දවස පටන් යනාදින් දක්නේයි—මීට ටීකා "පච්ඡිම මාසස්ස පඨමදිවසතො පට්ඨායාති, ජෙට්ඨමූල පුණ්ණමාසියා පච්ඡිමපාටිපදදිවසතො පට්ඨාය"—පශ්චිම මාසයාගේ පළමුවෙනි දවසපටන්ය යනු, පොසොන්පුර පසළොස්වකට පසු පැළවියපටනි— මෙසින් අධිකඇති වර්ෂවලද නැති වර්ෂවලද පොසොන්මස පුර පසළොස්වක ගිය අව පැළවිය පටන් වැසිසළු සෙවීමට

ක්ෂෙත්‍රය ලැබෙනබව දතයුතුයි—"පච්ඡි මදබ මාසස්ස පඨම
දිවසතො පට්ඨායාති එත්, ජෙට්ඨමූල කාළ පක්ඛුපොසථ
පච්ඡිම පාටිපද දිවසතො පට්ඨාය යාව ආසාළ්හි පුණ්ණමා
යදස්ස වඩ්ඪමානො ගිම්හානං පච්ඡිමඩ්ඪමාසො නාම"-මෙහි
අර්ථ කියා ඇති— මේ ටීකා පාලිය දැක්වූයේ ග්‍රීෂ්ම පශ්චිමාර්ධ
මාසය වැසිසළු කරණ නිවාසන යන්ට කෙතයයි භගවත
පිණිසයි—ඉන්නිසා පොසොන් අමාවකට අනතුරු පූර පෑළ
වියපටන් අඩමසක් අධික ඇත්තාවූද නැත්තාවූද සෑම අවු
රුදුවලම වැසි සළු කිරීමටද ඇඳීමටද ක්ෂෙත්‍රවන බව දතයු
තුයි—ඉන්නිසා පොසොන්මස අව පෑළවියපටන් පසළොස්ද
වසක් වැසිසළු පයෙෂිෂණ ක්ෂෙත්‍රයට හැර පොසොන් අමාවක
ට අනතුරු පූර පෑළවියපටන් පසළොස්දවසක් වැසිසළුවේ
කරණ නිවාසන ක්ෂෙත්‍රයට හැර පශ්‍යුදින අධිකනැති වර්ෂ
යෙහි වස්එළඹීම සහ වැසිසළු ඉවීමද, අධික ඇති වර්ෂයෙහි ඒ
දවස් පටන් මාසයක් ඉක්මවා වස්එළඹීම සහ වැසිසළු ඉවීමද
චාරිත්‍රයක් බව දතයුතුයි—අධික ඇති වර්ෂයෙහි වැසිසළු ඉවී
ම දෙවෙනි ඇසළයෙහි වේ—දෙවෙනි ඇසළයක් ඇතිබව
කෙසේ දතයුතුද යත්—විනයාලංකාරයෙහි—"රාජපන උප
කට්ඨාය වස්සූප නායිකාය වෙදසමයෙ වස්සුක්කඩ්ඪන සම්භ
වතො භික්ඛූනං පඨමා සාළ්හමාසෙ වස්සං අනුපගන්ත්වා දු
තියා සාළ්හමාසෙ උපගමනත්ථං යදිපනායස්ම ආගමෙ ජුණ්හෙ
උපගච්ඡෙය්‍යාථාති දූතං පාහෙසි"—රජතෙම වනාහි, වස්එළ
ඹීම ලංවූකල්හි වෙදසමයෙහි වස්සුක්කඩ්ඪනය ඇති බැවින්
භික්ෂූන්ට පළමුවෙනි ඇසළමාසයෙහි වස් නොඑළඹ දෙවෙ
නි ඇසළමාසයෙහි එළඹෙනපිණිස ඉදින් ස්වාමින් වහන්සේ
ලා එන්නාවූ පෞර්ණමාසියෙහි, නොහොත් පෞර්ණමාසියට
ලංවූ පෑළවිය දිනෙහි වස්එළඹුනාහු නම් මැනවයි දූතයෙකු
යැවූ යේයි-යන්නෙන්ද"පඨමාසාළ්හ මාසස්ස ජුණ්හ පක්ඛපි
කාළ පක්ඛපි දුතියාසාළ්හමාසස්ස ජුණ්හපක්ඛපි පණ්ණර
සී උපොසථං කත්වා පාටිපද දිවසෙ තිථියොගං වා නක්ඛත්ත
යොගං වා අනොලොකෙත්වා අරුණුග්ගමනතො පට්ඨාය
යාව පුනාරුණුග්ගමනා සකලදිවසරත්තියං යථාජ්ඣාසයං ව
ස්සං උපගතො සූපගතොව හොති නත්ථි කොචි දොසොති ද
ට්ඨබ්බං"—පළමුවෙනි ඇසළමාසයාගේ ශුක්ලපක්ෂයෙහිද කා
ළ පක්ෂයෙහිද දෙවෙනි ඇසළමාසයාගේ ශුක්ලපක්ෂයෙහි
ද පණ්ණරසී පොහොය කොටැ පෑළවියදවස්හි තිථි යොග
යක්හෝ නක්ෂත්‍ර යොගයක් හෝ නොබලා අරුණෝද්ගමනය

පටන් නැවත අරුණෝදගමනය දක්වා සියලු දිවාරෑ දෙක්හි අදහස්වූ පරිද්දෙන් වස්එළඹුනේ යහපත්වූ එළඹුනේනම් එයි කිසි දොෂයක් නැත්තේයයි දතයුතු෴

මෙසේ ශාසනික ප්‍රකරණවල අධිකමාස ඇති වෂීයට ඇසළ දෙකක් ඇතිබව පෙනෙන්නේය—තවද රාමඤ්ඤ දෙසයෙන්, රාමඤ්ඤාධිපති රජහු විසින්, ලංකාවේ භික්ෂු සංඝයාගෙන් උපසම්පදා ලැබීම පිණිස, ලංකාවට එවූ භික්ෂුසංඝයා ආවාවූ වෂීයෙහි ඇසළමාස දෙකක් තිබුන බවද එම දෙවෙනි ඇසළමාසයෙහි කාලපක්‍ෂ එකොළොස් වෙනි බුද දින උපසම්පදා මංගලය කළ බවද කල්‍යාණිප්‍රකරණයෙහි දක්වා තිබෙයි—ඒ බව කල්‍යාණිප්‍රකරණ යෙහි—“ තස්මිං පන නාග සිඛිනාග සංවච්ඡරෙ දුරාසාළ්හභාවා පඨමාසාළ්හ මාසස්ස කාල පක්ඛෙ” යනාදීන් දන්තේසි—ඒ පාඨය ඉතා දික්බැවින් මෙහි නොලියන ලදී෴

මෙසේ ශාසනික පොත්වල පමණක් නොවැ වෙදාංග පොත්වලද අධිකඇති වෂීයෙහි ඇසළ දෙකක් ඇතිබව දක්වා තිබෙයි෴ශ්‍රීධර ටීකායෙහි—“මාඛවාදි සංඥානාං ෂණ්ණාම් මෙෂාදිරාශීනා මන්‍යතරස්මින් රාශෞ යදා චන්ද්‍රමසොගත්‍යා මාසාධික්‍යඤ්චවති තදා තස්මින් වත්සරෙ මිථුන කර්කටක රාශිමයස්ස්‍ය චාන්ද්‍රමාසද්වයස්‍යාෂාඪසංඥත්වාත් විරාෂාඪ සංවත්සරො භවති තස්මින් වත්සරෙ කර්කටක රාශෞ විෂ්ණොඃ ස්වාපො භවති”—මාඛවාදී නම් ඇත්තාවූ මෙෂාදී ෂට්රාශීන් අතුරෙන්, එක්තරා රාශියෙක්හි, යම් කලෙක්හි සඳුගේ ගමනින් මාසාධික බවක් වේද, එකල්හි, ඒ වෂීයෙහි මිථුන කටක දෙරාස සිටි චාන්ද්‍රමාස දෙකකට ආෂාඪ යන නම් ඇතිවන බැවින් විරාෂාඪ සංවත්සරය වේ—ඒ අවුරුද්දෙහි කටක රාසැ විෂ්ණුගේ ශයනය වේ෴ඒ බැවිම,

“මාඛවාදෞෂු ෂට්ස්වක මාසි ද්‍ශිමයං යදා,
විරාෂාඪස්සවිඥෙයඃ ශෙතෙච ශ්‍රාවණෙ චහුතඃ”—

මෙෂාදි ෂට්රාශීන් අතුරෙන් එක් සෞර මාසයෙක්හි යම් කලෙක්හි අමාවක් දෙකක් වේද, ඒ විරාෂාඪ කාලයයි දතයුතු—ශ්‍රාවණයෙහි විෂ්ණුද හොවී෴මින් ඉහතකී පාඨයෙන් මථුන කටක දෙරාසැ ඇසළ දෙක වන බවද එයින් කටකෝ වන මසැ විෂ්ණු හෝනා බැව්ද කියා ඒ අර්ථයම පිහිටුවන පිණිස කී උදාහරණයෙකි—ඒ ඇසළ දෙක ඇති වසෙ ශ්‍රාවණයෙහි විෂ්ණු හොවිසි කීවේ දෙවෙනිඇසළය ශ්‍රාවණය වෙනු

වට ගණන් වන හෙයිනි—මෙයින් ඇසළ දෙකක් අධිකඇති වර්‍ෂයෙහි වනබවත් ඉන් දෙවෙනි ඇසළය ශ්‍රාවණ නමිනුත් ව්‍යවහාරවන බවත් ප්‍රකාශය—

“මිථුනසෙථා යදා භානු රමාවාශ්‍යමයංස්පෘශෙත්
ව්‍රාෂාඪස්ස විඥෙයො විෂ්ණුස්සවපිති කක්කටෙ”—

යම්කලෙක මිථුනයෙහි සිටි හිරුතෙම අමාවක් දෙකක් ස්පර්‍ශ කෙරේද ඒ ව්‍රාෂාඪ කාලයයි දත යුතුයි, විෂ්ණුතෙම කට කයෙහි හොවී—මෙහි විෂ්ණුගේ ශයනය කියන්නේ නම් පවිත්‍රාරම්භ විධියට විෂ්ණුගේ ශයනය ඕනෑකරණ බැවිනි— අධික මාසයක්වූ කලැ ස්වභාව ශයනයට මාසයක් පසුවැ සය නයයි කියනලද හෙයින් අධික මාසය එහිදී දක්වන ලදී— මෙහි කියනලද දෙවෙනි ඇසළය ශ්‍රාවණ නමිනුත් ව්‍යවහාර යට පැමිණි හෙයින්ද, ප්‍රකෘති ශ්‍රාවණයක් ව්‍යසානෙ මූල ඇති හෙයින්ද නිකිනි දෙකක් කියන්ටත් පුළුවන් එම අධිකඇති වර්‍ෂයේ මය—තවද, යම් අවුරුද්දක ඇසළ දෙකක් වූයේ නම් එම ඇසළ පෞර්‍ණමාසී දෙකට අනතුරු අව පැළවිය දෙකෙක් ලබනහෙයින් නිකිනි දෙකය කියන්ටත් පුළුවන— එයින් ප්‍රථම නිකින්නිය නොහොත් දෙවෙනි ඇසළය උත්ක ඪ්නය කොට ගිම්හානයාගේ පශ්චිමවූ ඇසළයම කරණ බව දතයුතු—මෙහාදි ෂට්රාශිය හැර අන්‍ය රාශියක හිරුසිටිකල් හි අමාවක් දෙකක් යෙදි මෙයින් අන්‍යමාසයක් අධිකවෙන් ටත් පුළුවන—ඒ බැව් මෙසේ දන්නේසි—

ශ්‍රීධර ටීකායෙහි—

“සෞරෙ කුම්භමාස්‍යමාවාස්‍යවයං විද්‍යතෙ චෙත් තදාධික ශ්චාන්ද්‍රමාසශ්ච මාඝ සංඥො භවති තදනනතරං ඵාල්ගුනශ්ච”-

සෞරකුම්භමාසයෙහි අමාවක් දෙකක් ඇතිවේනම්, එ කල්හි අධිකවූ චාන්ද්‍රමාස තෙමේද ඊට අනතුරු ඵාල්ගුන මා ස තෙමේද මාඝ යන නම් ඇතිවේ—මෙසේ ජ්‍යොතිශ්ශාස්ත්‍ර ක්‍රමයෙන් ඇතම් අවුරුද්දක අන්‍ය අධිකයක් වූයේ නමුත් වස්තු කකාඪ්නය කිරීමේදී ඇසළ මාස දෙකක්ම වනබව දතයුතු— එබැවි විනයාලංකාර යෙහි තත්වූ පරිද්දෙන් දක්වා තිබේ—

අධික වන්නාවූ මාසයේ නම නොකියා සංක්ෂෙපයෙන් අධි ක ඇති වර්‍ෂය දැක්වීමට කියනලද සලකුණු නම්—

"සවිතුඃ මණ්ඩලමෙති යදෘශශී
තදනු සංක්‍රමණං කුරුතෙ රවිඃ,
මඛ මහොත්සව නාසකරස්තදා,
මුනිවරෛඃ කථිතො ධික මාසකඃ"—

යම් කලෙක්හි චන්ද්‍රයා සූර්‍ය්‍යමණ්ඩලයකරා ඒද ඊට අනුව හිරු සංක්‍රමණය කෙරේද එකල්හි යාග පූජෝත්සවයන් නැති කරන්නාවූ අධික මාසය තෙම ඍෂිවරයන්විසින් කියනලදී—

තවද—"දර්ශවයං භවෙද්‍යත්‍ර රවිසංක්‍රාන්ති වර්ජිතං. අධිමාසස්ස විඥෙයො" යනාදීන්ද, "පර්වවය මතික්‍රම්‍ය යදාසංක්‍රමතෙ රවිඃ" යනාදීන්ද, එකරවියක්තුළ අමාවක දෙකක්වීම අධිමාසය ඇති වන්නී ඇඳිනීමට ලකුණක්කොට දක්වනලද කියමන් බොහෝයි—මෙහි පර්වශබ්දයෙන් කීතැන "පර්ව" යනු පූරපසළොස්වකයයි ඇතම් කෙනෙක් කියත්—"පර්වශබ්දඃ පඤ්චදශ්‍යන්තවර්තිනතෙ ශිත කෘෂ්ණයොඃ"යනුහෙයින්"පර්ව"ශබ්දයෙන්ම ශුක්ල කෘෂ්ණ, පසළොස්වක් දෙක්හිම වැටෙන නුමුත් මේ අධිමාසකථායෙහිදී අමාවක්හිම වැටෙනබැව් ශ්‍රීධරයෙහි කියනලදී—ඒ මෙසේය—"පර්වවයමිති පාඨෙපි, පර්වමාත්‍රයොගාද්ධිකමාසොසතීති පක්ෂෙ වචනා භාවාදමාවාශ්‍යවයයොගාදෙව සෞරමාසව්‍යධික මාසත්වාත් වචනාන්තර සංවාදාච්ච පර්වශබ්දෙනාමාවස්‍යෙව විවක්ෂිතා"—පර්වවයං යන පාඨය ඇති කල්හිදූ පර්වන් ශබ්දයෙන් පූරඅව පසළොස්වක් දෙකම කියනලද හෙයින් පර්වමාත්‍රයක් නොහොත් පර්වවය මාත්‍රයක් යෙදීමෙන් අධිකමාස ඇතැයි පක්ෂයෙක්හි වචනයක්නැතිහෙයින් අමාවක්දෙක යෙදීමෙන්ම සංක්‍රම සංඛ්‍යාත සෞර මාසයට අධික චාන්ද්‍රමාසය වනබැවින් වචනාන්තර සංවාදඇතිබැවින්ද නොහොත්, වචනාන්තරයෙන් මනාකීම් හෙයින්ද පර්වන් ශබ්දයෙන් අමාවාසියම කියනුකැමති කරනලදී—

මෙසින් පූරාණ කාලවලදී මෙකල්හි මෙන් වාද නැතිබව දතයුතු-මෙහි"වචනාන්තර සංවාදාච්ච"යන ටීකා වචනයෙන් ඒ කාලවලත් දැන් සෙසින් එකසංක්‍රමයක්තුළ පූරපසළොස්වක දෙක යෙදීමෙනුත් අධිකයයියන වාද තිබුනායයි කියත්-"සංවාද"යනු විවාදයක් නොවේ, ඔවු නොවූන් විරුද්ධව කාරණ කථාවට හෝ අනුන්ගේ දෝස්දක්වා කිමටහෝ"සංවාද"යන නමක්නැතිබැව් දැනගත්කල්හි ඒ කල්පනාව නූපදී,මෙහි කියන ලද්දේ"දර්ශ"යනාදී වෙන නම්වලින් බොහෝසේ කියන ලද්දේනම් අන්‍ය වචනයකින් මනාකොට කිමයයි ගැනේ—

පර්වත් ශබ්දය අමාවක්හි නොවැටෙයි ඇතම් කෙනෙක් කියත්

ඒ බොහෝ නිඝණ්ටු ආදී පොත් නොදැකීමෙන් හෝ අන් කිසි පරිද්දෙකින් හෝ වරදවා කීමෙකි — එනම්, දෛවඥ මුඛමණ්ඩනනම්වූ නක්‍ෂත්‍ර නිඝණ්ටුවෙහි—"පර්වශබ්දඃ පඤ්චදශෙෂ්වන්තෙ ශිතකෘෂ්ණයොඃ" යි—පර්වත් ශබ්දය තෙම ශුක්ල කෘෂ්ණ සංඛ්‍යාත පඤ්චදශී දෙක්හි වැටෙයි කියනලදී—ඇතම් කෙනෙක් පර්ව සන්ධි ශබ්දයෙන් කියන ලද්දේ පර්වයමයයි කියත්—"සපර්ව සන්ධිඃ ප්‍රතිපත් පඤ්චදශ්‍යොර්යදන්තරම්"-ප්‍රතිපත් පඤ්චදශ්‍යඃ, පළමුවෙනි වකය පසළොස්වෙනිවකය යනමේ දෙදෙනාගේ; යත් අනන්තරං, යම්අනන්තරයෙක් ඇද්ද; සඃ, ඒ තෙම; පර්වසන්ධිඃ, පර්වසන්ධිනම — මෙසින් අමරකොෂයෙහි, පුරහෝ අවහෝ පසළොස්වෙනි තිථියටත් පළමුවෙනි තිථියටත් අතර පර්වසන්ධියයි කියනලදී—පර්වත් ශබ්දයතෙම "ග්‍රන්ථිනා පර්වපාරුෂී" * කිතැනාදී පුරුකට නමැයිකියනලදී—"තිථිභෙදෙ ක්‍ෂණෙ පර්ව" යනතැන, තිථි භෙදයෙහිද ක්‍ෂණයෙහිද පර්වත් ශබ්දය වැටෙයි කියනලදී — ඒ තිථිභෙදය පුරඅව පසළොස්වක් දෙකයි — තවත් පර්වත් ශබ්දය අමාවක්හි වැටෙනබැව්—"පෞෂො මාසඃ ඵාල්ගුණඃ පර්වන්ද්‍රඃ" යනාදින්ද—"අමාවාශී දිවා පර්ව පරිච්ඡෙදඃ ශම්පගඃ" යනාදින්ද දතයුතුයි — "පර්වමය මතික්‍රම්‍ය" යනාදී පාඨයෙන් අධික ලකුණුකියා නැවතත්—"සිනීවාල්‍ය" යනාදී පාඨවලින් කියනලද්දේ අධික දෙයාකාර යෙකැයි ඇතම්කෙනෙක් කියත්ලූ-නොයෙක් ක්‍රමවලින් එකතැනම එකකාරණය පිණිස ලකුණු ආචාර්‍ය්‍යවරයෝ කියත් — ඒ ශ්ලොකගණනින් ප්‍රභෙද නොකටහැකිය, ඒ සිනීවාල්‍ය ශබ්දයෙන් කියන ලද්දේ සොළොස්කලා අපරිච්ඡින්න අමාවකයි—තවද අධිමාසඇති වර්‍ෂ දැනගැන්මට පුර පසළොස්වකින් ගතයුතු ලකුණු නම්—විනයාලංකාරයෙහි—"කදාචි පන හායන කාලෙ තිථියො නක්ඛත්තානිච විසමො හොන්ති තස්මා තං සමෙතුං අධිමාස පතනකාලෙ මාසම්පි දිවසම්පි ආකඩ්ඪිතබ්බං"-කිසියම් කාලෙක්හි සංවත්සර කාලය තෙම තිථියෙන්හා නක්‍ෂත්‍රයෙනුත් විෂමවේ, එහෙයින් ඒ සමකරනුපිණිස මාසයකුදු දවසකුදු ඇදීයයුතුයි — මෙසින් ප්‍රකාශකරන්නේනම් පොහොය කරගෙනඅ පිළිවෙළින් ඒ ඒ මාසවල පෞර්ණමාසී ආදියට යෙදියයුතු නකත් නොයෙදීමෙන් තිථි නක්‍ෂත්‍රාදීන්ගේ විසම වීමෙන් කාලය විසම වූයේනම් අධික මාසයක් ඇතැයි දැනඇරිය යුතු

* "ග්‍රන්ථිඃ පර්ව පරුශ්චාථ" අභිධාන රත්නමාලා—2—31

බවය—සියම් රටවාසි පණ්ඩිතයන්විසින් කියනලද ක්‍රමය
ක්නම්—

> "යදා පච්ඡිම මාසස්ස නක්ඛත්තං චවනාරහං
> නාතික්කමති පුණ්ණින්දු අධිමාසො තදාභවෙ"

යම්කලෙක පූර්ණචන්ද්‍රතෙම පශ්චිම මාසයාගේ නකත චව
නයට සුදුසුකොට නොයික්මවාද එකල්හි අධිමාසය වේ—
මේ ක්‍රමයනම්, යම් මසක පුර පසළොස්වකට යෙදියයුතු න
කතක් යෙදුනායින්පසු ඊලඟ මාසයේ පුර පසළොස්වකට
යෙදියයුතු නකත චන්ද්‍රයා නොවලඳූනම්, අධිමාසය ඇතැයි
දතයුතු බවය—තවද—

> "එකස්මිංයෙවච බෙත්තම්හි පුණ්ණමීනං වසෙනතු
> විඤ්ඤෙය්‍යත්‍යධිකො මාසො තං තං කාලාති රෙකිකො"

එකම ක්ෂෙත්‍රයෙක්හි පෞර්ණමාසි දෙකෙන් වනාහි ඒ ඒ
කාලයෙන් ඉතිරිවූ අධිකමාසය තෙම හැගේ—ක්ෂෙත්‍රපිළි
වෙළ යට කියාඇති—තවද මෙහි කියනලද අධික යුක්ත වර්ෂ
වල යෙදියයුතු ලකුණුවලින් සමහර ලකුණු ඇතම් අධික
අරිණ අවුරුදුවලින් පිටත්ව ඒ ලඟම යෙදේ—ඒ ලකුණු
නොයෙදුනත් සමහර ලකුණු යෙදීමෙන් මාසයන්ගේ විස
මය පෙනෙන හෙයින් ඒ සමකරනු පිණිස අධික අරිනුලැ
බේ—තවද, චාන්ද්‍රමාසය දෙයාකාරයක් නිසා අධිකමාසයත්
දෙයාකාරයෙකැයි ඇතම් කෙනෙක් කියත්-චාන්ද්‍රමාස දෙයා
කාරවන්නේ ගන්නා ඉම්වලැ ක්‍රමයෙන්ය, චාන්ද්‍රමාස දෙළස
අමුතු වන්නෝ නොවෙත්—ඉරසඳ දෙදෙනාගේ ගමන්
භෙදයෙන් වන්නාවූ යම් අධිකයක් නොහොත් වැඩිවීමක්
ඇත්නම්, ඒ වැඩිවීම එකතැනකම වියයුතුය—අධිකමාස
දෙයාකාරයක් ඇත්නම් පූර්වාචාර්‍ය්‍ය වරයන්ට විප්‍රකාර අධික
ය යන අර්ථය තේරෙණ වචනයක් අධික දක්වන පොතක
ලියන්ට බැරි කමක් නැත—එකලඟ වර්ෂදෙකක පුර පැළ
වියෙන් ලබනමාස ක්‍රමයෙන් ඇසළ දෙකවීමය අවපැළවි
යෙන් ලබනමාස ක්‍රමයෙන් නිකිනි දෙකවීමයයි ඇතම් කෙ
නෙක් කියත්—එලෙසනම් එක එක ලඟ අවුරුදු දෙකෙක
වැඩිවූ මාසය පුරපැළවියෙන් ලබන චාන්ද්‍රමාස ක්‍රමයෙන්හෝ
සෘතු මාස පිළිවෙළින් හෝ වැඩිව චාන්ද්‍රමාස ඇදිනිමත් සෘ
තු බෙදන පිළිවෙළත් දැනගත්අයට වැටහෙයි—එකම අ
ධිමාසයට ඒ දෙයාකාරයෙන්ම ඉම් සොයාගන්ම පුළුවන්ව
ඇත—මෙහි කී ඇතම් වර්ෂවල ඇසළයෙන් අන්‍යමාසය තුදු

වැඩිවෙයි එසේත් ඇසළ දෙකකොට අධික ඇරිය සූත්‍රයයි
කියනලද කියමන ඇසළ දෙකවීම අධිකයයි කී කීමට විරු
ඬයයි ඇතම් කෙනෙක් පිරිහෙළතැයි සිතමු—අන්‍යමාසයක්
වැඩිවූවත් ඇසළය පටන් මාසවිසමය ජේන හෙයින්ද ඇස
ළය ලඟටම අප්‍රකෘති මාසය සෘතු ශුද්ධකරණ ක්‍රමයෙන් අරි
ණ හෙයින්ද, එහි විරුඬතාවක්නැත—දෙවෙනි ඇසළය අධි
කයට ඇද පළමුවෙනි ඇසළය වෙනුවට තැබූකලැ පළමුවෙ
නි ඇසළය නියම සංඛ්‍යාවෙන් ඇරෙණ බැවින් ඉතිරි වූයේ
ඒ මසයයි ඇතම් ආචාර්‍ය්‍යවචන දැක්වූකලැ 'දෙවෙනි ඇසළය
අදිනවාය යනු ඊට විරුඬයයි කියා ඇතම් කෙනෙක් උභතො
කොටිකකොට වාදකරත්,ධර්‍මතාව බැලූකලැ විරුඬවූඑකකො
නකුත් නොපෙනේ-තවද, අධික වන්නේනම් චාන්ද්‍රමාසයෙකි
චාන්ද්‍රමාස දොළසගේ ඇඳින ගැන්මනම් ඒ ඒ මාසවල පෞර්‍ණ
මාසී ආදී ප්‍රධාන ස්ථානවලට නියමවූ නකත් යෙදීමෙන්වේ—

යම් කලෙක චාන්ද්‍රමාසයක් අධික වීනම් එක මාසයකට
ඇති නකත් ලකුණුවලින්යුත් මාස දෙකක්ඇති—ඉන් වැ
ඩිවූ මාසය උඩට ඇද්දකලැ සෘතුමාසයෝ සමවෙත්—අධික
මාස ඇති අවුරුදු දැනගන්ට බලන ගණන් ක්‍රමයක් නම්—

“තත්‍ථ කලියුග ගණනෙ එකූනවීසති ගණනෙන භාජි
තෙ, වි පඤ්චට්ඨ දස තෙළස සොළස අට්ඨාරස වසෙන සතන
ධා සෙසො හොති තෙසං වසෙන වෙමාධිමාස පඤ්චාධි මා
ස චසවධි මාස දසාධි මාස තෙරසාධි මාස සොළසාධිමාස
අට්ඨාරසාධි මාසා ඉති වොහරන්ති, අට්ඨාරසාධි මාසම්පන
ඔසානාධි මාසන්තිපි වොහරන්ති”—එහි කලියුග වර්‍ෂගණන
එකුන් විසිගණනින් බෙදූ කල්හි දෙකය,පසය, අටය, දසය,
තෙලෙසය, සොළසය, 'අටළොසයයි' ගණන් සතක් ශෙෂ
වේ— ඒ ගණන් වසයෙන් වෙමාධි මාසය, පඤ්චාධි මාසය,
චසවධිමාසය, දසාධි මාසය, තෙරසාධි මාසය, සොළසාධිමා
සය, අට්ඨාරසාධි මාසයයි ව්‍යවහාර කෙරෙත්—
අට්ඨාරසාධි මාසය වනාහි අවසානාධි මාසයයි කියාද ව්‍යවහා
රකෙරෙත්-මේ පාඨය විනයා ලංකාර යෙහිය——මෙකී ක්‍රම
යෙන් කලියුග වර්‍ෂය දහනවයෙන් බෙදූකලැ අධිකඇති වර්‍ෂය
ට, දෙක, පස, ආදී කියනලද ගණනක් ඉතිරිවේ—එම වර්‍ෂයේ
යට කියනලද අධික ලක්ෂණත් යෙදීඇත——“තාලා ලො
ලාළි” යනාදි ගණිතයත් මීට සමවේ—මෙසේ යම් පමණ
ලකුණු එකකින් එකක් සංසන්දනය වීමෙන් සාර වසයෙන්
පෙනේද ඒ සියල්ලම ගතයුතු—මෙසේ අධික හැරීම දැන

කටයුතුයි—*

අප විසින් යට කියනලද මාස ක්‍රමය දැක්වීමෙහි ආදිකල්පයේ
හිර උදාවූයේ කුම්භරාශියේ අන්තයෙන් බව පූර්වාචාර්ය්‍ය වචන
වලින් දක්වා ඇත-එසේවූ කලැ සූර්ය්‍ය උදාවූ රාශියෙහි පටන්
අවුරුදු ව්‍යවහාර නොකොට දැන් මේ කාලයෙහි මේෂ රාශි
යට හිරු පැමිණි දින පටන් අවුරුදු ව්‍යවහාරය කරණුයේ කු
මක් හෙයින්දයත්

ජ්‍යොතිශ්ශාස්ත්‍රයෙහි වනාහි චෛත්‍රමාසයේ ශුක්ලපක්ෂයෙ
හි පැළවිය ආදිකොට වර්ෂ ගණිත්, ඒ සූර්ය්‍යාගේ උදාවීම පටන්
නොවේය, එසේ උවත් ඒ පැළවියට බොහෝ අවුරුදුවලැ න
ක්ෂත්‍රයන් ගෙන් මුල්වූ අස්විදය ආදීන් යෙදෙන හෙයින් ඒ කා
ල චක්‍රයාගේ මුලක් බව පෙනෙයි-එසේම මේෂය කාලපුරුෂ
යාගේ හිසයයි කියනලදී-එහිද, මුල අස්විදය පිහිටා තිබෙයි-
මේ ආදි කරුණුවලින් රාශිචක්‍රයාගේ මුලක් බව ආචාර්ය්‍ය වර
යන් විසින් දැන ඒ මුලට ඉරු පැමිනීම පටන් සූර්ය්‍යවර්ෂය ව්‍ය
වහාර කරණු මිස කල්පොත්පත්තියෙහි මේස රාශින් හිරු
උදාවූබැවින් නොවේ—පූර්‍ණපසළොස්වක දවසේ ඉරසඳ උදා
වූයේ නුමුත් මාසයේ මුලට පැළවිය ගත්තේ තිථීන්ගේ ක්‍රමය
බලාගෙන මිස උදාවූ පිළිවෙළින් නොවේ—ඉම් තුනකින්
සෘතු බෙදෙන්නේත් ඒඒ ශාස්ත්‍රක්‍රම බලාගෙනමුත් ඉරහඳ
පහලවූ ක්‍රමයකින් නොවේ—දෙවවර්ෂ බ්‍රහ්මවර්ෂයන්ගේද
පටන් ගැන්මත් මෙසේ මැයි— ඇතම් නක්ෂත්‍ර ක්‍රමවලදී
මීනය ආදිකොට ගණන් කරන්ට නියම කළ ගැණුම් තිබේ—

මේ ආදි කරුණුවලින් මේෂරවියේ පටන් ගන්නා වර්ෂය
කල්පොත්පත්තියෙහි ඉරසඳ උදාවූ පිළිවෙළින් නොවන බව
දතයුතුයි

තවද සර්වඥයන් වහන්සේ පිරිනිවි වර්ෂයෙහි අධික මාස
යක් ඇද්ද නැද්දයත්—එහි අධිකමාසයක් නොතිබුනු බ
ව බුදුන් පිරිනිවි වෙසක්පුර පසළොස්වක පටන් දෙමසක්
ගෙවා මහකාශ්‍යප තෙරුන්වහන්සේ ආදි රහතුන් වහන්සේ
ලා රජගහනුවර වස්එළඹුනු බව අටුවා ටීකා කථා වලින්
පෙනෙන හෙයින් ඇගේ—ඒ වර්ෂය කලියුග වර්ෂයෙන් කී වෙ
නි වර්ෂයක්ද යත්—එසේ බලා දැනගන්ට කැමති අය විසින්

---

* ගැණ බැලීම කටයුතු වන්නේ—ඍමවැ පැවති කාලය ප
ටන් කොපමණ කලකින් අධිමාසය පිරේදැයි දැනගන්නා පි
ණිසයි-අධිමාසොත්පත්ති ආදිය ශිරොමණි සිද්ධාන්තයේ-සෞ
රාන්මාසා දෛනවඃ සෘාලලක්ෂියාන්—යනාදියෙන් ප්‍රකාශයි—

කලියුගවර්ෂය වඩා අඟහෙයින් යම් කැමතිවූ වර්ෂයෙක ලිත රැගෙන ඒ වර්ෂයෙහි කලියුගවර්ෂය තබා බුඩවර්ෂයේ සාධ්‍යව ඉන් හැරියකලැ ශෙෂවූයේ බුදුන් පිරිනිවි වසේ කලියුග වර්ෂයයි දතයුතුයි—ඒ ක්‍රමයෙන් බැලූකලැ බුදුන් පිරිනිවියේ කලියුග ගණනින් (2558) දෙදහස් පන්සිය පණස් අටවෙනි වර්ෂයේ යයි පෙනේ—එසේ පෙනෙන්නේ එකී පිරිනිවි වස හැර මෑත වර්ෂගණන බුඩවර්ෂයයි ගත් කල්හි වේ—එලෙස ගැන්ම යුතුද යත්—එසේ ව්‍යවහාරයට පැමිණි බැවින් යුතුයි—ව්‍යවහාරයට එපරිද්දෙන් පැමිණිබව කෙලෙස දතයුතුද යත්—

සමන්තපාසාදිකා වෙහි—"එවං ඉට්ඨියාදීහි සද්ධිං ආගතාවො පතිට්ඨහන්තොව ආයස්මා මහින්දත්ථෙරො සම්මා සම්බුද්ධ පරිනිබ්බානතො ද්වින්නං වස්සසතානං උපරි ඡත්තිංසතිමෙ වස්සෙ ඉමස්මිං දීපෙ පතිට්ඨහිති වෙදිතබ්බො"—මෙසේ ඉට්ඨිය තෙරුන් වහන්සේ ආදීන් සමග අවුත් පිහිටන්නාවූ ආයුෂ්මත් මහෙන්ද්‍රස්ථවිරතෙම සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පිරිනිවීමෙන් වර්ෂ [200] දෙසියයෙකින් මතු [36] තිස්සවෙනි වර්ෂයෙහි මේ ද්වීපයෙහි පිහිටියේයයි දතයුත්තේය—ටීකා සාරාර්ථදීපනියෙහි—"පරිනිබ්බානතොති පරිනිබ්බානවස්සතො තං අවධිභූතං මුඤ්චිත්වා තතො උද්ධං ද්වින්නං වස්සසතානං උපරි ඡත්තිංසතිමෙ වස්සෙති අත්ථො ගහෙතබ්බො"-පරිනිබ්බානතො යනු පිරිනිවී වසිනි, ඒ සීමාවූ වස හැර ඉන් මත්තෙහි [200] දෙසියයක් වර්ෂයන්ගේ මත්තෙහි [36] තිස්සවෙනි වසෙහියයි අර්ථය නෙම ගතයුතු වේ—

මෙහි කියනලද ක්‍රමයෙන් වර්ෂයේ ගැණීම හැගෙන්නේ මෙලෙසයි—අජාසත් නම්වූ රජ දඹදිවැ රජගහ නුවර රජකෙළේ (32) දෙතිස් අවුරුද්දයි—ඉන් අටවෙනි අවුරුද්දේ වෙසක් මාසේදී බුදුරජතෙම පිරිනිවන්පා වදාළෙයි—ඒ අටවෙනි අවුරුද්ද හැර ඉන් මතු ලිත්වලැ ලියන ක්‍රමයෙන් (236) දෙසිය තිස්සවෙනි වසේ ලංකාවට මිහිඳුමහාස්වාමිතෙම වැඩිසේක-ඒ පිරිනිවන්පෑ වසත් සමගනම් (237) දෙසිය තිස් සතක් වේ—මෙතැන්හි "තං අවධිභූතං මුඤ්චිත්වා" යන ටීකා වචනයෙන්, සීමාවූ දවසයයි නොහොත් වෙසක්මස පසළොස්වක දවසහැර ඉන් මත්තටයයි ඇතම් කෙනෙක් කියත්—පිරිනිවන් පෑවේ ඉතා අලුයම් වේලේ නිසා එහි සීමාවූ දවසක් නැති—ටීකා මතය එසේ නොවේ—එසේ නම් "පරිනිබ්බානතොති පරිනිබ්බාන වස්සතො" කීය යුතු නොවේ—"තං අවධිභූතං" යන්නෙන් ඉහතින් කී වර්ෂයම හැ

ගෙනුම්ස දවසක් නොකියනලද හෙයින් ඒ නොහැගේ෴
මේ අසීය දැනගන්නා පිණිස තවත් සෙවිය යුතු කරුණු
ඇත්මය—ඒනම්—

සමනත පාසාදිකා වෙහි—

"අජාතසත්තුස්සහි අට්ඨමෙ වස්සෙ සම්මාසම්බුද්ධො පරිනි
බ්බායි තස්මිං යෙව වස්සෙ සීහකුමාරස්ස පුත්තො තම්බපණ්ණි
දීපස්ස ආදිරාජා විජයකුමාරො ඉමං දීපමාගන්ත්වා මනුස්ස
වාසං අකාසි"— අජාසත් රජහට (8) අටවෙනි වසේ සම්‍යක්
සම්බුද්ධතෙම පිරිනිවීයේයි, ඒ වසෙහිම සිංහ කුමාරයාගේ
පුත්‍රවූ තාම්‍රපණ්ණිවීපයට පළමුවෙනි රජවූ විජය කුමාර තෙ
ම මේ දිවයිනට අවුත් මනුෂ්‍ය වාස කෙළේයි෴ "තත්‍ථ අ
සොක ධම්මරාජස්ස සත්තරසමෙ වස්සෙ මුටසීව රාජා කාලම
කාසි දෙවානං පියතිස්සො රජ්ජං පාපුණි"—එහි, නොහොත්
දඹදිවැ ධර්මාශොක රජහට (17) දහහත්වෙනි අවුරුද්දේ මු
ටසීව රජ කාලක්‍රියා කෙළේයි දෙවැනිපෑතිස්ස තෙම රාජ්‍යය
ට පැමිණියේයි෴මේ ක්‍රමයෙන් සර්වඥයන් වහන්සේ පිරිනිවි
වසත් ලංකාවේ විජය කුමාරයා රජවූ වසත් එකම අවුරුද්ද
බව පෙනේ—ටීකාවේ කීමේ ප්‍රකාරයට පිරිනිවි අවුරුද්දම
ඉමට ඇර බුධවර්‍ෂය ගන්නා නම්, ඒ බුධවර්‍ෂයෙන් (236) දෙසිය
තිස්සයවූ කාලයට ලංකාවේ රජපිළිවෙළින් (237) දෙසිය
තිස්සතක් අවුරුදු ගණන් වෙයි—එසේ නැතුව පිරිනිවි ද
වස ඇර මත්තට ගණන ගන්නානම් වැඩි අවුරුද්දක් නැති
හෙයින් ලංකාවෙන් එම (236) දෙසිය තිස් සාවුරුද්දම විජ
ය කුමාරයා රජවූ පළමුවෙනි අවුරුද්දපටන් දෙවැනි පෑති
ස්ස රජුගේ පළමුවෙනි අවුරුද්දට ගණනින් පෙනී ඇත—

මේ ගණන බලන්නේ කෙලෙසද?— ධර්මාශොකරජහට
(17) දසසත් වෙනි වසේදී, මුටසිවරජ මළේයි—ධර්මාශොක
රජහට (18) දහඅටවෙනි අවුරුද්දේ මහෙන්ද්‍රස්ථවිරයන්
වහන්සේ ලංකාවට වැඩියේයි෴

ඒ මුටසිව රජ කාලක්‍රියා කළාට දෙවෙනි අවුරුද්දයි—

විජය කුමාරයා රජකමට පත්වූ අවුරුද්ද පටන් මුටසිවරජ
කාලක්‍රියා කළ අවුරුද්දට ගණන් කොට ඊලඟ මහෙන්ද්‍රස්ථ
විරයන් වහන්සේ ලංකාවට වැඩිය වර්‍ෂයත් සමග ගණන්බැ
ලූකලැ ඒ අවුරුද්ද බුධවර්‍ෂයෙන් කී ගණනට සමද එකක්
අඩුදැයි පරීක්‍ෂා කරනු මැනවි෴කොතැනින් පරීක්‍ෂා කට
යුතුද?—මහාවංශයෙනි—එහි—

“ඡිත්වාන පුබ්බචරිතං විසමං සමෙන
ධම්මෙන ලංකා මඛිලං අනුසාසමානො
සො තම්බපණ්ණිනගරෙ විජයො නරින්දො
රජ්ජං අකාරයි සමා ඛලු අට්ඨතිංස”—

විජයරජ—38.

“තස්මිං මතෙ අමච්චා තෙ පෙක්ඛන්තා ඛත්තියාගමං,
උපතිස්සගාමෙ ඨත්වාන රට්ඨං සමනුසාසිසුං—
මතෙ විජය රාජම්හි ඛත්තියාගමනා පුරා,
එකං වස්සං අයං ලංකා දීපො ආසි අරාජිකො”—

ක්ෂත්‍රියයෙක් එනතුරු උපතිස්ස රජකම් කළේ වර්ෂ—1.
ඊලඟට රජ වූනේ පණ්ඩුවාසදේවයි—

“ලංකාපාලො පණ්ඩුවාස දෙවො රජ්ජමකාරයි,
තිංස වස්සානි ජාතම්හි මතො සො පණ්ඩුකාභයෙ”—

පණ්ඩුවාස දෙව—30.
ඊලඟට රජවූනේ අභයයි—

“එසො විසති වස්සානි අභයො භය දූසකො
තස්සොපතිස්සගාමම්හි රාජා රජ්ජමකාරයි”—

අභය රජ—20.

ඊලඟට පණ්ඩුකාභය අභිෂෙක නොලබා කලක් සිටියේයි,
ඒ ගණන—17

“පණ්ඩුකාභය රඤ්ඤොච අභයස්සච අන්තරෙ,
රාජසුඤ්ඤානි වස්සානි අහෙසුං දසසත්තච”—

අභිෂෙක ලබා—

“සො පණ්ඩුකාභය මහීපති සත්තතිංස
වස්සො ධිගම්ම ධිතිමා ධරණී පතිත්තං,
රම්මෙ අනූන අනුරාධ පුරෙ සමිද්ධෙ
වස්සානි සත්තති අකාරයි රජ්ජ මෙත්ථාති”—

පණ්ඩුකා භය—70.
ඊලඟට රජවූනේ මූටසිවයි—

“සට්ඨි වස්සානි මූටසීවො රාජා රජ්ජ මකාරයි,
අනුරාධ පුරෙ පවරෙ ලංකාභූ වදනෙ සුභෙ”—

මූටසිව—60.

ධර්මාශොක රජහට (17) දහ හත්වෙනි වසේ මූටසිව රජ කා
ලක්‍රියා කළේයි-දෙවෙනි පෑතිස්ස රජ පළමුවෙනි අභිෂෙක

යත් ලැබූයේයි—ධර්මාශොක රජහට (18) දහඅටවෙනි වසේ ලංකාවට මහෙන්ද්‍රස්ථවිරයන් වහන්සේ වැඩිසේක-ඉහත රජ පරම්පරාවේ අවුරුදු ගණන දෙවෙනිපෑතිස් රජුගෙන් එක වර්ෂයක් සමග එක්කළ කල්හි (237) දෙසිය තිස්හතක් වේ—

දඹදිව රජකළ රජවරුන්ගේ ගණනින් බුදුන් පිරිනිවි වර්ෂය හැර ඉන් මත්තට ගත්කලැ ගණන පෙනෙන්නේ මෙසේයි-

බුදුන් පිරිනිවි වස අජාසත් රජහුගේ (8) අටවෙනි වසයි—

ඒ හැර, අජාසත් රජ (24) විසි හතරයි, උදය භද්‍ර (16) සොළසයි, අනුරුධ මුණ්ඩ දෙදෙන (8) අටයි, නාගදස්සක, (24) විසි හතරයි, සුසුනාග, (18) දසඅටයි, කාලාශොක, (28) විසිඅටයි, කාලාශොක පුත් දසබෑ රජවරුන්, (22) විසිදෙකයි, ඉන්පසු නවනන්ද රජදරුවන්, (22) විසිදෙකයි, චන්ද්‍රගුප්ත, (24) විසි හතරයි, බින්දුසාර, (28) විසිඅටයි, ධර්මාශොක, අනභිෂික්තව, (4) හතරයි, අභිෂෙකයෙන් (18) දහඅටවෙනි වසේ මහෙන්ද්‍රස්ථවිරයන් වහන්සේ මේ දිපයෙහි පිහිටියේයි—

එහෙයින් කියනලදී—"අභිසෙකතො අට්ඨාරසමෙ වස්සෙ ඉමස්මිං දිපෙ මහින්දථෙරො පතිට්ඨිතො"යි—ධර්මාශොක රජහුගේ අභිෂෙකයෙන් (18) දසඅටවෙනි වූ යේත් දෙවැනිපෑතිස්රජුගේ (1) පළමුවෙනි වූ යේත් පිරිනිවි වස හැර (236) දෙසිය තිස් හවෙනි වූ යේත් එකම වර්ෂයයි—මෙකී ගණන් එක්කොට බැළූ කලැ සේරම (236) දෙසිය තිස් හයයි—

අජාසත් රජහුගේ (8) අටවෙනි වර්ෂය හැර ඉන් මත්තට සූවිස්ස පටන් මහේන්ද්‍රස්ථවිරයන් වහන්සේ ලංකාවට වැඩිය වර්ෂය දක්වා බුද්ධවර්ෂය බැළූකලැ (236) දෙසිය තිස්සයක් පෙනේ—නමුත් බුදුන් පිරිනිවි දවසේම ලංකාවට ආ විජය කුමාරයා රජ වූ වර්ෂය පටන් ලංකාවේ රජ පරම්පරාවෙන් මහෙන්ද්‍රස්ථවිරයන් වහන්සේ ලක්දිවට වැඩි වර්ෂය දක්වා ගණන් බැළූ කලැ (237) දෙසිය තිස් සතක් පෙනේ—බුද්ධවර්ෂය පිරිනිවි වස හැරලා ගණන් නොගත්තානම්, බුදුන් පිරිනිවි වසේ රජවූ විජය රජහුගේ මුල වර්ෂය පටන් ගණන් ගත්තාම එකක් වැඩිවන්නේ කුමක්දැයි පරීක්ෂා කටයුතුයි-ඒ එකක් වැඩිබව පෙනුනු කලැ තමන් කළ වාදය මුල්සිඳී යන බවට භයව අඩානගානීවැ සිටින අය, මුටසීව රජ රජකළේ අවුරුදු (59) පණස් නවයයි කියත්, එසේ නුමුත් ලංකාවේ රජුන් රජකළ වර්ෂගණන් ලියනලද සියලුම පොත්වලැ මුටසීව (60) සැට වර්ෂයක් රජ කෙළේ යයි ලියා තිබෙන හෙයින්, එයින් වර්ෂයක් කඩාගෙණ (59)

පණස් නවයකර අඥාන සමූහයාට පෙන්වන නුමුත් ඒ පොත් ලියන ලද පරිද්දෙන් තිබෙද්දී ඒ පිණිස පණ්ඩිතයන් රචනා නොපිළිවනි—

ඉන්නිසා ඒ වර්ෂය බුදුන් පිරිනිවි වසහැර රජවරුන්ගේ වර්ෂ ගණනින් (236) දෙසිය තිස් සවෙනියි—පිරිනිවි වස සමග ගණන්වූ කලැ (237) දෙසිය තිස් සත්වෙනියි—

නවද, සමන්ත පාසාදිකා වෙහි—"ජම්බුදීපෙ උදයභද්දස්ස චුද්දසමෙ වස්සෙ ඉධ විජයො කාලමකාසි. උදයභද්දස්ස පඤ්චදසමෙ වස්සෙ පණ්ඩුවාස දෙවො නාම ඉමස්මිං දීපෙ රජ්ජං පාපුණි"—

දඹදිව උදයභද්‍ර හට (14) තුදුස්වන වසේ, මෙහි ලංකාවේ විජය රජ කාලක්‍රියා කළේයි, උදයභද්‍ර හට (15) පසළොස්වෙනි වසේ පණ්ඩුවාසදේව නම් කුමාරතෙම මේ ද්වීපයෙහි රාජ්‍යයට පැමිණියේයි—

මෙකී පිළිවෙළේ සැටියට, අජාසත් රජගේ (32) තිස්දෑවුරුද්දෙන් බුඬවර්ෂයට ගත් (24) විසිහතරත් උදයභද්‍රගෙන්(14) දහහතරත්, දඹදිව රජපිළිවෙළින් ගත් කලැ ලංකාවේ විජයගේ (38) තිස්අට පිරේ, එකලැ දඹදිව උදයභද්‍රගේ (15) පසළොස් වෙනි වර්ෂයෙහි, මෙහි පණ්ඩුවාස දෙව රජ්ජීය සි කි හෙයින් ,[14] දහ හතරටත් (15) පහළොහටත් අතරේ තවත් එකක් නැති හෙයින් ලංකාවේ විජය පණ්ඩුවාසදෙව දෙදෙනාට අතරේ අරාජිකව උපතිස්ස රජකාමේ වැඩකළ අවුරුද්ද පෙනෙන්නේ නැත—

එය කෙලෙස ගත යුතුද ?—

උදයභද්‍රගේ (14) තුදුස්වන වස පැමිණිකලැ විජය රජ කාලක්‍රියාකළ බැවින් උපතිස්ස වැඩ බැලූවේ ඒ වර්ෂයේ මයි—එ කල්හි විජයරජට (38) තිස්අට වෙන්නේ බුඬවර්ෂයේ ගණනාට නොගත් අජාසත් රජහුගේ (8) අටවෙනි වර්ෂයයි කියන ලද විජයකුමාරයා ලංකාවට ආවාවූද බුදුන් පිරිනිවියාවූද වර්ෂයත් සමගයි—

ඒ බැව් අටුවාවේ සංක්ෂෙපයෙන් කි හෙයින් විස්තර කොට කියන්නාවූ ශාරිපුත්‍රස්ථවිරයන් වහන්සේ විසින් ටීකා සරත්ථදීපනියෙහි මෙසේ දක්වන ලදී—

"චුද්දසමෙ වස්සෙති, චුද්දසමෙ වස්සෙ සම්පත්තෙ, ඉධ විජයො කාලමකාසීති, ඉමස්මිං තම්බපණ්ණිදීපෙ විජය රාජ කුමාරො අට්ඨතිංස වස්සානි රජ්ජං කාරෙත්වා කාලම කාසි"—

"චුද්දසමෙ වයෙස" යනු (14) තුදුස්වන වර්ෂය පැමිණි කල්හි
ය "ඉධ විජයො කාලමකාසි" යනු, මේ තාම්‍රපර්ණී ද්වීපයෙහි
විජය රාජකුමාරතෙම (38) තිස්අටක් හවුරුදු රාජ්‍යය කරවා
කාලක්‍රියා කළේයි—

"තථාහි අජාතසත්තුරාජා චතුත්තිංස වස්සානි රජ්ජං කාරෙසි උ
දයභද්දො සොළස තස්මා අජාතසත්තුස්ස අට්ඨමවස්සං මුඤ්චි
ත්වා ඉධ විජයස්ස පඨමවස්සන්ති කත්වා තතොප්පභුති අජාතස
ත්තුස්ස පඤ්චවීසති වස්සානි උදයභද්දස්ස චුද්දසමෙ වස්සෙ
අපරිපුණ්ණෙ යෙව විජයස්ස කාලකතත්තා තං මුඤ්චිත්වා උ
දයභද්දස්ස චුද්දස වස්සානීති විජයස්ස අට්ඨතිංස වස්සානි
පූරිංසු"—

එසේමැයි අජාසත් රජතෙම (32) දෙතිස් හවුරුද්දක් රාජ්‍ය
ය කරවූයේයි උදයභද්‍ර (16) සොළසක් රාජ්‍යයකරවූයේයි එ
හෙයින් අජාසත් රජහුගේ (8) අටවෙනිවස හැර මෙහි විජය
රජගේ පළමුවෙනි වසයයිකොට එතැන් පටන් අජාසත්
රජහුගේ (25) විසිපස් හවුරුද්දකි, උදය භද්‍රගේ (14) තුදුස්
වෙනි වස නොපිරුණ කල්හිම විජයරජ කාලක්‍රියා කළබැ
වින් ඒ (14) තුදුස්වෙනි වස හැර උදයභද්‍රගේ [13] තෙළෙස්
හවුරුද්දක් දැයි විජයහට [38] තිස්අට අවුරුදු පිරුණු හුයි—

මෙකී ක්‍රමයෙන් අජාසත් රජහුගේ [8] අටවෙනි වසේ විජය
කුමාරයා ලංකාවේ රාජ්‍යයට පැමිණි නිසා ඒ අවුරුද්දත් සමග
අජාසත්රජහුගෙන් [25] විසිපස් අවුරුද්දක් විජය රජහට
පිරුණු බවද, බුදුන් පිරිනිවී ඒ [8] අටවෙනි වස හැර බුද්ධ
වර්ෂයට ගත් හෙයින් අජාසත් රජහු ගෙන් [24] විසිහතරක් බුද්ධ
වර්ෂයට ගත්බව පෙනෙන්නේයි— තවද ලංකාවේ රජකළ
රජුන්ගේ ගණනින් බුද්ධවර්ෂය ගන්නා කල මුලින් වර්ෂයක්
හැර ගන්නා බව සාරාර්ථ දීපනියෙහි මෙසේ කියන ලදී—

"තම්බපණ්ණි දීප වාසීනම්පි රාජූනං වසෙන ගණනා එවං
වෙදිතබ්බා සම්මා සම්බුද්ධස්ස පරිනිබ්බාන වස්සං ඉධ විජයස්ස
පඨමවස්සන්ති කත්වා තං අපනෙත්වා පරිනිබ්බානතො විජය
ස්ස සත්තතිංසවස්සානි, තතො අරාජික මෙකං වස්සං පණ්ඩු
වාස දෙවස්ස තිංස වස්සානි අභයස්ස වීසති වස්සානි පණ්ඩු
කාභයස්ස අභිසෙකතො පුබ්බෙ සත්තරස වස්සානි අභි
සිත්තස්ස සත්තති වස්සානි මුටසිවස්ස සට්ඨි වස්සානි දෙවා
නංපියතිස්සස්ස පඨමවස්සන්ති එවං පරිනිබ්බානතො ද්විනානං
වස්සසතානං උපරි ඡත්තිංස වස්සානි වෙදිතබ්බානි"—මෙහි
අභිප්‍රාය නම්—තාම්‍රපර්ණී ද්වීපවාසී රජුන්ගේ වසයෙන් ද

ගණන මෙසේ දත යුතු-සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ ප
රිනිවි වස මෙහි විජය රජුට පළමුවෙනි වසයයි නියම කොට
ඒ වර්ෂයහැර පිරිනිවි වසින් මතු විජයරජගේ [37] තිස්සත් අවු
රුද්දකි ඉන්මතු රජෙක් නැති [1] එක අවුරුද්දක, පණ්ඩුවාස
දෙවගේ [30] තිස් අවුරුද්දක, අභයගේ [20] විසි අවුරුද්දක,
පණ්ඩුකාභයගේ අභිෂෙකයෙන් පූර්වයෙහි [17] දහහත්අවු
රුද්දක—අභිෂෙක කළහුගේ නොහොත් අභිෂෙකයෙන්
මතු [70]හැත්තෑ අවුරුද්දයි, මුටසිවගේ [60] සැට අවුරුද්දක,
දෙවැනි පෑතිස්රජගේ [1] පළමුවෙනි අවුරුද්දය, මෙසේ පිරි
නිවීමෙන් වර්ෂ [200] දෙසියයෙකින් මතු [36] සතිස් අවුරුදු
දතයුතු——මෙකියන ලද්දේ මහෙන්‍ද්‍රස්ථවිරයන් වහන්සේ
ලංකාවට වැඩිය අවුරුද්දේ බුද්ධ වර්ෂයයි—විජය කුමාරයා ලං
කාවට ආවෙත් බුදුන් පිරිනිවන් පෑවෙත් එක අවුරුද්දේ එකම
දවසේයි—විජය රජහු රජකළ (38) තිස්අට අවුරුද්දෙන් මුල
අවුරුද්ද ඇර බුද්ධවර්ෂයගත් ක්‍රමය කී කලැ පිරිනිවි වර්ෂය ගණ
නට නොගත් බැව් නොහැගේද ?—මේගැණත් ඇතම් කෙ
නෙක්, විජය රජහුගේ පළමුවෙනි අවුරුද්දයයි කිවේ එක ද
වසට යයි තමන්ගේ වාදය අත්නොහරණපිණිස කියත්-ඒ
කියන්නාහා සමගම ගැම නුවනැත්තන්ටම බොරුව බව
හැගේ—

මේ වර්ෂ කථාවේදී අටුවාවට ටීකාව විරුද්ධයයි ඇතම් කෙ
නෙක් කියත්, අටුවාවත් ටීකාවත් දෙක නොතේරෙන හැම
දෙනාටම එසේ සිතේ, ඒගැන ඒ පොත්වලැ අර්ථ දැනගෙන
ඒ ඇත්තන් විසින්ම සැකදුරුකරගන්නා බවහැර වෙන කටයු
ත්තක් නොවේ——මෙති පිරිනිවී වර්ෂය හැර වර්ෂ ගණන ගත්
කලැ බුදුරජානන් වහන්සේගේ ජීවත්වීමේ (80) අසූ අවුරුද්දට
වැඩි වෙයි යනාදින් ඇතම් කෙනෙක් කියත්-උපන් දිනපටන්
පිරිනිවි දින දක්වා ගැන්නකලැ මෙසේ මේ වර්ෂය ව්‍යවහාර
කළාට එසින් අවු වැඩි නොවන බව යන්තම්වත් සිහිඇතිහැ
ම දෙනාටම වැටහේ—රජ වරුන්ගේ පරම්පරාවේ ඉම ගැත්
මත් වෙසක් මාසේ පසළොස්වක් දවසින්ම වෙයි, එබැවින්
අජාසත් රජහුගේ (8) අටවෙනි වර්ෂයෙහි අන්තිම දවස වෙ
සක් මස පුර පසළොස්වක් යුත් බුදුන් පිරිනිවි දවසයයි ඇතම්
කෙනෙක් කියත්——ඒ කීම කිසි පණ්ඩිත කෙනෙක් පිළිනො
ගනිත්—වෙසක් මාසේ පුර පසළොස්වක් දවස අන්තකොට
ගන්නා ලද පූර්ණවර්ෂයක් ලොක ව්‍යවහාරයෙහි අප්‍රකටයි—
බුද්ධවර්ෂයේ ඉම වෙසක්පුර පසළොස්වකින්වේ—

තවද, හැම රජවරුන්ගේම ඒ දවසේ කාලක්‍රියාවක් වත් ඒ දිනම අභිෂෙක කිරීමක්වත් නැත—අභිෂෙකය දෙවැනිපෑතිස් රජුගෙන් මැත මිස ඉන් පෙර වෙසක්මසැ පුර පසළොස්වකද, නැතිබව සාරාර්ථ දීපනී යෙහිත් කියන ලදි—

තවද, ඊට උදාහරණ යත් නම්-සාරාර්ථ දීපනී යෙහි,-"ජම්බුදීපෙ අසොකධම්මරාජස්ස සත්තරසමෙ වස්සෙ ඉධ මුටසිවො නාම රාජා සට්ඨිවස්සානි රජ්ජමනුසාසිත්වා කාලමකාසි"—
දඹදිව ධර්මාශොක රජහට (17) සතළොස් වන අවුරුද්දේ මෙහි මුටසිව නම් රජතෙම (60) සැට හවුරුද්දක් රාජ්‍යානුශාසනා කොට කාලක්‍රියා කළේ යි—"දෙවානං පියතිස්සො රජ්ජං පාපුණි'ති, අසොක ධම්ම රාජස්ස අට්ඨාරසමෙ වස්සෙ පාපුණි"—දෙවැනි පෑතිස්තෙම රාජ්‍යයට පැමිණියේය යනු ධර්මාශොක රජහුගේ (18) අටළොස්වෙනි වසේදී පැමිණියේයි-

මේ කීමේ සැටියට මුටසීව රජහුගේ මරණයටත් දෙවැනි පෑතිස්සගේ අභිෂෙකයටත් අතරේ ධර්මාශොක රජහුගේ (17) දහහත් වෙනි අවුරුද්දේ ඉම ඉක්මිලා තිබෙන බව පෙනෙන්නේයි—මොග්ගලිපුත්තතිස්සස්ථවිරයන් වහන්සේ විසින් ප්‍රත්‍යන්තයන්හි ශාසනය පිහිටුවන පිණිස ඉල්මාසෙහි සංඝයා පිටත් කළාඩින් පසු, මුටසිව රජ මහලුව ඉන්නා බැව් මහෙන්ද්‍රස්ථවිරයන් වහන්සේ දැක වදාළ බව මහාවංසාදි පොත්වලැ ලියා තිබෙන බැවින් මුටසිව රජ කාලක්‍රියා කළේ ඉන් පසුයයි හැඟේ—දෙවැනිපෑතිස්සගේ පළමුවෙනි අභිෂෙකය—"තෙ මග්ගසිර මාසස්ස ආදි චන්දොදයෙ දිනෙ අභිසිත්තා සුව ලංකිඤ්ඤං"-යනාදීන් උඳුවප් මස පුර පැළවියද බවද, දෙවැනි අභිෂෙකය "වෙසාඛෙ නරපති පුණ්ණමායං මෙවං"යි වෙසක් මස පුරපසළොස් වක් දිනබවද පෙනෙන්නේයි-මෙහි කියනලද රාජ්‍යප්‍රාප්තිය දෙවැනි අභිෂෙකයෙන් යයි හැඟේ—දෙකෙන් කොයි අභිෂෙක යෙන් හෝ වේවා ඉල්මාසයෙන් මතු වෙසක්මස පුර පසළොස් වක්දිනෙන් පූර්ව ධර්මාශොක රජහුගේ (17) දහහත්වෙනි වර්ෂය ගෙවී තිබෙන්නේයි—ඒ රජවරුන් ගේ වර්ෂය ගෙවෙන් නොත් වෙසක්මස පුර පසළොස්වකිනැයි කියන්නන්ගේ කීමේසැටියට වෙසක් මස පුරපසළොස් වක ගියාඩින් පසු පැළවියපටන් අනික් වර්ෂය ලැබිය යුතුයි—

එලෙස වර්ෂ සීමාවක් නොතිබුන බව මෙයින් ප්‍රකාශමය— මෙයින් අජාසත් රජහුගේ වර්ෂයෙහි ඉම වෙසක්මස පුර පස

ළොස්වක නොවනා බවින් බුදුන් පිරිනිවි වර්ෂය හැර ඉන් මෙ
පිට අවුරුද්ද පටන් බුදුන්ගේ පිරිනිවීමෙන් එක්වෙනි දෙවෙ
නිආදි වසයෙන් බුඬවර්ෂ ගණන ලොකයෙහිද සමන්ත පා
සාදිකා සාරාර්ථ දීපනී විනය පොත් ආදි පොත් වලද ව්‍යව
හාරයට පැමිණ තිබෙන බව සිහිඇති හැමදෙනාටම ප්‍රකා
ශයි—ඉන්නිසා කලියුග වර්ෂයෙන් බුදුන් පිරිනිවන් පා වදාළේ
කවර වර්ෂයෙක්හිදැයි පරීක්ෂා කරණ විට සාරාර්ථ දීපනී පාඨා
නු සාරයෙන් ළිතේ ලියාතිබෙන බුඩවර්ෂය ඒ ළිතේම තිබෙන
කලියුග වර්ෂයේ ගණනින් ගැරියම්ට ඉතිරි වන්නේ බුදුන් පිරි
නිවි අවුරුද්දේ කලියුග වර්ෂයයි දතයුතු-එසේ කළ කලැ ඉතිරි
ව පේන්නේ (2558) දෙදාස් පන්සිය පණස් අටය—ඒ වර්ෂයේ
අධික යෙදෙන තිසම පිළිවෙළින් අධිකයක් නැත—බුදුන් පිරි
නිවි අවුරුද්ද ලග අවුරුද්ද කලියුග වසින් (2559) දෙදාස් පන්
සිය පණස් නවයයි-සාරාර්ථ දීපනියේ කිමේ සැටියටත් සමන්ත
පාසාදිකාවෙන්හා මහාවංසයෙන් පෙනෙන ගණනෙන් සැටි
යටත් ඒ වර්ෂයට බුදුන්ගේ පිරිනිවීමෙන් නොහොත් බුඩ වර්ෂ
යෙන් එකය කියා ව්‍යවහාර කළ බව පෙනේ—එසේ වීනුමුත්
බුදුන් පිරිනිවි තැන් පටන් මාස ගණන් ශුඬකර බලා ගන්
ට ඕනෑ කලාම, ඒ වර්ෂයේ වෙසක්මසැ පසළොස් වක දිනේදී
අවුරුද්දක් සම්පූර්ණ බව පෙනේ—ඉන් මෙපිට මාස ගණ
නේ පිළිවෙළින් දෙවෙනි අවුරුද්ද බව පෙනෙන්නේය—
නුමුත් ලොකව්‍යවහාරයෙන් බුඩ වර්ෂයෙන් එක්වෙනිය ය
න සංඛ්‍යා නාමය ලැබුවේ ඒ කලියුගයෙන් (2559) දෙදාස්
පන්සිය පණස්නවවෙනි වර්ෂයයි-එහි අධිකමාසයක් ඇත—
මේ ක්‍රමයෙන් බුඩ වර්ෂය තත්වූ පරිද්දෙන් ගත්කලැ අධිකමා
ස පිළි වෙළ වෙනින් කාටවත් දියයුතුයයි ඇතම් කෙනෙක්
කියත්ලු—ඒ ඔවුන්ගේ මන්දබුඩි තාවකි—බුදුන්ගේ පිරිනිවීම
ර්‍ට ඉහත වූවත් (2559) දෙදාස්පන්සිය පණස් නවයේ යෙදු
න තෙරසාධිමාසය වෙනින් අවුරුද්දක අරින්ටවත් වෙනකෙ
නෙකුට භාර දෙන්ටවත් බැරිමය—

බුදුන් පිරිනිවි වස ඉමට ඇරලා බුඩවර්ෂය ව්‍යවහාර කෙළේ
නැතැයි කියන නැනැත්තන්ගේ කිම ඔප්පුකරණ පිණිස "මා
යාබ්‍ය ලොම කුශතුංග"-යනාදි ශ්ලොකයේ ක්‍රමයෙන් ශුඬ දි
නය බැඳ ලිත ගැණලා බුදුන් පිරිනිවන් පෑවේ කලියුග වසින්
(2559) දෙදාස් පන්සිය පණස් නවයේ යයි භගවන්ට පූළුව
නැයි ඇතම් කෙනෙක් කියත්ලු—ඒ කියන්නේ ගණිතයේ පි
ළිවෙළ නොදන්නා බැවින් වියයුතුය-බුඩ වර්ෂයේ මාස ගණ

න කෙලෙස වුවත් ඇන් ගණිනා ශකවර්ෂයේ ගණනට සමගෙ න ලෙස කියක් නුමුත් තබාලා අඩුවැඩි කලාම ශකවර්ෂ යෙන් ගැන්න සැපියටම ලිත ගණින්ට පුලුවනි-එලෙස කියන ඇත් තෝ ශකවර්ෂ (1779) එක්දහස් සත්සිය හැත්තෑනවයේ අවු රුද්ද ගණින විට, (535) පන්සිය තිස්පහ කරගෙණ ගණින් නේ කුමක්දැයි සිතුවේ නැති වෙන්ට ඇති—ඒ ගණින්නේ (535) පන්සියතිස්පහේ ලිතමයයි සිතන්වත් ඇතැයි සිතමු—

මේ තත්වය හැඟුනොත් ඔය කියමන් එලෙස නොකියත්—

සමක තත්වය නොදැන කියන කියමන්වලැ ප්‍රයෝජන යක් නැත—තවද, මූසික, වෘෂභ, ව්‍යාඝ්‍ර, ශශ, නාග, සර්ප, අශ්ව, අජ, කපි, කුක්කුට, ශ්වාන, ශූකර—යන මාදස සංවත් සර යන්ගේ ව්‍යවහාරය ලංකාවට පැමිණ තිබෙන්නේ සියම් දෙසයෙන් යයි අසනු ලැබේ—ඒ ව්‍යවහාරය එසේ පැමිණි යේ සියම් දේසයෙන් ලංකාවට උපසම්පදා මංගලය පිණිස ම හා සංඝයා වැඩිය තැන් පටනැයි දැනගන්ට ලැබී තිබේ—

ඒ සියම් දේසයෙහි, බුඩ වර්ෂයට ඒ නම්යොදා මේ වතාතුර පවත්වනා ක්‍රමය ඒ දේස වාසී ස්ථවිරයන් වහන්සේලා විසින් ගාථා බන්ධනය කොට මේරටට එවා තිබේ, ඒ මෙසේයි—

“බුඩස්සබො භගවතො පරිනිබ්බුත කාලතො
විසු වස්සසහස්සෙසු විසුවස්ස සතෙසුච—
එකූනාසීතාධි කෙසු අතික්කන්තෙසු සබ්බසො
අස්සයුජස්ස පුණ්ණමහි පතො පාටිපදෙ, අයං—
ආදිතො පන්ධ ගණනා කාතබ්බා පටි පාටියා,
දපීන යාධ්‍ය සතෙකා සො විනිඥ්ඥුප ලක්ඛිතො—
නාගසංවච්ඡරෙ නාම වෙදිතබ්බොච කාලතො,
යොරෙ පියානං නියමෙන තෙසං ක්‍රිස්තුස්ස ජාතිතො.
සංවච්ඡරානං සහස්සෙ ගතෙ සත්ත සතාධිකෙ
ජත්තිංසුත්තරෙ මාසස්ස ඔක්තොබෙරාඥ ධානිතො,
ජට්ඨා දිවසා පට්ඨාය ආරබ්භො ජානනාරහො”—

මෙහි අභිප්‍රාය, භාග්‍යවත් බුදුරජානන් වහන්සේගේ පිරි නිව් කාලය පටන් අවුරුදු (2279) දෙදහස් දෙසිය සැත්තෑ න වයක් සර්වප්‍රකාර යෙන් ඉක්මුන කල්හි, වප්මස ශුක්ල පක්ෂයෙ හි මේ පැලවියයි—මුල පටන් පක්ෂ ගණන පිළිවෙළින් කට යුතු—ඒ වර්ෂය තෙම විනිඥ්ඥුප ලක්ෂිතවූ දපීනය නම් ශක වර්ෂයයි, නාග සංවත්සරය නමැයි කල් වසයෙන් දත යුතුයි.

ඒරොප රට වාසීන්ගේ නියමයෙන්, ඔවුන්ගේ ක්‍රිස්තුගේ
ඉපදීමෙන්— (1736) එක්දහස් සත්සිය තිස් හයක් ගිය කල්හි
ඔක්තෝබර නම් මාස යාගේ සවෙනි දින පටන් ආරම්භයතෙ
ම දතයුතුයි—එකී දවස පටන් පස්ස වශී වසයෙන් ගැණී
මේ ආරම්භය දතයුතුයි සේකී—මෙහි කී ශකවර්ෂය මේරටේ
ව්‍යවහාර වන ශකවර්ෂය නොවන බැවින් අපට නියම කරන්
ට නොහැකිය—මෙකී [2279] දෙදහස් දෙසිය හැත්තෑ නව
යේ බුද්ධ වර්ෂය ගෙවෙන්නේ, සාරාර්ථදීපනී ආදියේ ජෝතිපර්ද්
දෙන් බැලූකලැ කලියුග වර්ෂයෙන් [4837] සාරදහස් අටසිය
තිස් හතේදිය—

ක්‍රිස්තු වර්ෂයෙන් [1736] එක්දහස් සත්සිය තිස්හය ගෙවෙන්
නේ, කලියුගයෙන් [4836] සාරදහස් අටසිය තිස් හයේ දිය-
ක්‍රිස්තු වර්ෂයෙන් [1736] එක්දහස්සත්සිය තිස්හය ඉක්මුනා
යින් පසු ලැබෙන ඔක්තෝබර මාසය ලබන්නෙත් කලියුග
යෙන් [4837] සාරදහස් අටසිය තිස්සතේ දිය, ඉන්නිසා මේ
නාග සංවත්සරයයි කියා තිබෙන්නේ කලියුග [4837] සාර
දහස් අටසිය තිස් සතකවට සැක නැත—බුදුන් පිරිනිවීත
ලියුග [2558] දෙදහස් පන්සිය පණස්අට වන්න සපී සංවත්සර
ය වූ විට සෙස්ස, අංගි; අජ, යනාදි ක්‍රමයෙන් ගැන්නාම මේ කී
වර්ෂය නාග සංවත්සරය වී තිබෙන්නේය—මේ ක්‍රමයෙන් සිය
මේ නියම කරපූ අවුරුදු කීප යක්ම සාරාර්ථ දීපනියේ කීමට ඒ
කඟව තිබෙන්නාහුය-හිනැටි කුඹුරේ ස්ථවිරයන් වහන්සේවි
සින්ද මිලින්ද ප්‍රශ්නයේ අග ලියන ලද බුද්ධ වර්ෂයට නියම කර
ණලද කාපිසංවත්සරයට බුද්ධ වර්ෂ [2320] දෙදහස් තුන්සිය විස්ස
ය මාසය නියම කරලා නැතිහෙයින් කලියුග යෙන් කොයි
වර්ෂයදැයි නියම කර ගැන්ම බැරිය, නුමුත් ඒක මෙකී ක්‍රමයට
වෙනස් මෙනි—

ඔයාකාර කාගෙන්වත් වෙනස්ව ලියවෙන්ට බැරිකමක්
නැත මක්නිසාද? සමන්ත පාසාදිකාවේ කියන ලද පණ්ඩුවා
සදේවගේ වර්ෂය දීපවංසයෙහි රිට සම්පූර්ණයෙන් වෙනස්
කොට ලියා තිබෙයි-මහාවංසයෙහි සමන්ත පාසාදිකාවේ කී
මට එකඟව ලියා තිබෙයි—ශක වර්ෂයෙන් කෝට්ටේ රජකළ
පරාක්‍රමබාහු නරේන්ද්‍රයාගේ වර්ෂය පංචිකා ප්‍රදීපයෙහි රාහුල
ස්ථවිරයන් වහන්සේවිසින් කිවාට විරුද්ධව නාමාවලි ආදියේ
ලියා තිබේ-මෙසේ නිසා එලෙස එකම ලියවිල්ලක් බලා යා
මෙන් මෙබඳු කරුණු නිශ්චය කරගැන්ම නොහැකිය-තවද.

සියම් රටේ ලියන බුද්ධවර්ෂය දෙයාකාරයකට ලියතැයි ඇතම් කෙනෙක් කියත්, ඒ එසේ නොවෙයි— "සම්මා සම්බුද්ධ පරිනිබ්බානතො තිසතාධිකානං චිනනං වස්සසතානං උපරි අට්ඨාසීතිමෙ සංවච්ඡරෙ" කියා තිබුනොත්, එම කියනලද වර්ෂයේමයි— "සතතා සීතියා සංවච්ඡරෙසු අතික්කන්තෙසු" කියා තිබුනොත් එම කියනලද වර්ෂය ගෙවුනායින් පසුය—

ඔය දෙයාකාරයෙන් එක වර්ෂය ලියා තිබුනා දුටුමු— ඒ දෙයේ වෙනස් වචන වර්තමාන ගත වසයෙන් දැනගත් කලැ ඒහි වෙනසක් ගැනෙන්නෙ නැත්මය—

නවද—මහා මහෙන්ද්‍රසථවිරන් වහන්සේ ලංකාවට වැඩිය වර්ෂයේ අධික මාසයක් තිබුනායයි ඇතම් කෙනෙක් කියත්—

ඒ වර්ෂයෙහි අධික මාසයක් නැතිය බව ඒ කථාව ලියනලද සැම පොත් වලින්ම පෙනෙන් නේය— ඒ බැව් සංක්ෂෙපයෙන් මෙසේ දතයුතුයි— මහා මහෙන්ද්‍රසථවිරයන් වහන්සේ මෙහි කියනලද ධර්මාශොක මහා රජහුගේ අභිෂෙකයෙන් [18] අටළොස් වෙනි වසේ පොසොන්මස පෞර්ණමාසී දින ලංකාවට වැඩිසේක, එතැන් පටන් සවිසිදිනක් ඉක්මවා ඇසළමස පූර තෙලෙස්වක් දවස්හි වස්වසනකාලය ලංවූ බැවින් වස්වසන්ට කල් ආසන්නයයි කැපවසයෙන් දෙවැනි පෑතිස් රජහට වදාළසේක, ඒ දැනගත් දෙවැනි පෑතිස් රජතෙම එනුවර හරියේ තිබුන අටසැට ලෙනෙන් කටයුතුවැ තිබුන කර්මාන්ත කරවා නිමකොට ඇසළමස පූර පසළොස්වක් දින විහාර පිළිගැන්වූයේය-ඒ විහාර පිළිගෙන මහාමහෙන්ද්‍රසථවිරයන් වහන්සෙ ආදි රහතුන් වහන්සේලා ඇසළමස පූර පසළොස්වකට පසු පැළවියදින වස්එළඹ දෙමිනිසුන්ට සංග්‍රහ කරමින් මාසයකොට වප්මස පූරපසළොස්වක්වූත් මහා පවාරණ දින පවාරණය කොට තවත් මාසයක් එහිම වාසය කොට ඉල්මස පූර පසළොස්වක්දින රජගෙට වැඩමවා මහරජ අපි දඹදිවට යනු කැමැත්තම්හයි වදාළසේක-මේ කථාව ලියාතිබෙන සමන්තපාසාදිකා මහාවංස දීපවංස බොධිවංස සාරාර්ථදීපනී ආදි පොත්වලැ පෙනී තිබෙන්නේ මේ පිළිවෙළිනි—

මේ අතර කළ ක්‍රියා විස්තරවසයෙන් ලියාතිබෙන ඒ කිසියම් පොතක ඒ අතර අධිකමාසයක් තිබුන සැටියක්වත් වස්සූපනායිකා ඛණ්ඩනයක් කළ සැටියක්වත් ලියානැත— නවද, දඹදිවින් වැඩිය පොසොන්මස පූර පසළොස්වක පටන් වස්සාන සෘතුව කෙළවර කළ ඉල්පූර පසළොස්වක දක්වා පසුකළ මාස

ගණනත් නියම කොට දීපවංසයෙහිත් ලියා තිබෙන්නේය—ඒ මෙසේයි—

"හිමවන්තෙ පඨමෙ මාසෙ පුණ්ණමාය උපොසථෙ
ආගතා ජම්බුදීපම්හා වසිම්හා පබ්බතුත්තමෙ—

"පඤ්චමාසෙතු වුත්ථම්හා නිස්සාරමෙව පබ්බතෙ,
ගච්ඡාම ජම්බුදීපන්තං අනුජාන රථෙසභ"—

පොසොන් ඇසළ දෙමසින් උපලක්ෂිතවූ ගිම්හාන සෘතුවේ පළමුවෙනිවූ පොසොන්මස පෞර්ණමාසීවූ දිනෙහි දඹදිවින් ආවෝ උතුම් පර්වතයෙහි විසූම්හ—පස්මසක් නිස්සාරමයෙහිද පර්වතයෙහිද විසූම්හ, දඹදිවට යම්හ නොහොත් යනුකැමැත්තම්හ ඒ අනුදනුව රථෙසභවූ මහා රජයි වදාළසේක—මෙහි පොසොන්පුර පසළොස්වක්දින පටන් ඇසළ පෞර්ණමාසිය දක්වා මාසයත් ඉන්මතු වස්සානයේ සාරමසත් එක්වූකලැ පස්මසහෙයින්, ඒ අතර අධිකමාසයක් නොහැරිය බවත් අධිකයක් ඇරියානම් පොසොන්පුර පසළොස්වකපටන් ඉල්පුර පසළොස්වක්දිනට සමසක් පියසූනුබවත් නුවනැති කාටත් හැඟේමැයි—ගණන් නියමනොකොට සාරාසීදීපනී ආදියෙහි කියනලද පිළිවෙළින් බැලූකලත් මේගණනම පේනහෙයින්ද, සමන්තපාසාදිකාවෙහි මහෙන්ද්‍රස්ථවිරයන් වහන්සේ ලංකාවට වැඩියදවස "ජෙට්ඨමූල පුණ්ණමා" යනාදින් නම්නියමකොට දක්වා තිබෙනබැවින්ද, වෙනින් මාසයක වැඩියේය කියාවත් ඒ අතර මාස සයක් විය කියාවත් සිහිඇත්තන් රවටන්ට කාටවත් බැරිය—මෙහි කී දීපවංසයේ ගාථා මාවිසින් කළ අනිකුදු ලියවිල්ලක ලියා සන්නත් ලියා ඇති—එසින් පිටපතක් කරණ කෙනෙක් අතින්, පස්මසක් කී වචනය දෙවරක් ලියවී තිබූනාට සමහරු දෝස්කියත් යයි කියත්-පොතක් පිටපත් කරණ කෙනෙක් අතින් වැරදුන යම්වචනයක් අකුරක් බලා ඒක පිටපතෙ ප්‍රමාද දෝෂයක්බව දැනගන්ට තිබියදී ඊට දෝස්කීම මේ ලෝකයෙහි පණ්ඩිතයන් ආශ්‍රයකළ කෙනෙක්වත් කියන කිමක් නොවේ—එසේ කියතොත් සමන්තපාසාදිකාවේ බොහෝ පොත්වලැ "අනුරුද්ධොච මුණ්ඩොච අට්ඨාරස" කියා තිබෙනතැනට කොපමණ දෝස්කියන්ට බැරිද?

තවද, දඹදිවට වඩින අදහසින් නොව ලංකාවේ ධාතුපිහිටුවන කැමැත්තෙන් දඹදිවට වන්නු කැමැත්තම්හ යන වචනයෙන් බොහෝතැන්වලැ කියාතිබෙන බැවින් දීපවංසයෙහි යම්හ යනවචනයෙන් කියාතිබීම වරදැයි සමහරු කියත්ලූ—

එකල්හි මහා මහෙන්ද්‍රස්ථවිරයන් වහන්සේගේ කැමැත්ත
ලංකාවේ ධාතු පිහිටුවනු පිණිසමුත් දඹදිවට වඩිනපිණිස
නොවනබැවින්" ඉධිජාම ජම්බුදීපං ගනාතුං" යන අටුවා පාඨය
ටත් දෙස් කියන්ට එබඳු අයට පූර්වනි-ඒ ලියමන ප්‍රමාද ලෙ
ඛනයක් නොවේ මය—යම්හයි කී කීම යන්ට නොකමැති
බැවින් බොරුවයයි ඇතම් කෙනෙක් කියත්—යන්ට කැමැත්
තක් නැතුව කැමතියයිකීම බොරුවයයි කියමන ඔවුන්ට ඉතා
මපාසුයි—තවද, ඒ අවුරුද්දේ නැත්තාවූ අධිකයක් තිබුනායයි
භගවන්ට උත්සාහකරන ඇතම්කෙනෙක්, ඒ අවුරුද්දේ චාතු
මාසිනි, නොහොත් සෑනුව කෙළවරකරණ පුරපසළොස්වක
දෙකක් තිබුනේයයි කියත්—එලෙස දෙකක් නොතිබුනබව
සමන්තපාසාදිකා සාරාර්ථ දීපනී ආදියෙහි කියා තිබෙයි—
සමන්තපාසාදි කාවෙහි—" අථායස්මා මහා මහින්දො, වුත්ථ ව
ස්සො පවාරෙත්වා කත්තික පුණ්ණමාසං උපොසථ දිවසෙ රාජා
නං එතදවොච"-ඉක්ඛිත්තෙන් ආයුෂ්මත් මහා මහින්ද්‍ර තෙම
වසනලද වස්ඇතිව, පවාරණයකොට කාර්තික පෞර්ණමාසි
යෙහි පොහෝදවස්හි රජහට මෙය වදාළේයි—ශ්‍රී—යනාදියට
ටීකා සාරාර්ථ දීපනීයෙහි—"පවාරෙත්වාති මහා පවාරණාය
පවාරෙත්වා කත්තික පුණ්ණමායන්ති අපරකත්තික පුණ්ණ
මාසං මහාමහින්දත්ථෙරො හි පුරිමිකාය උපගන්ත්වා වුත්ථවස්සො
මහාපවාරණාය පවාරෙත්වා තතො එකමාසං අතික්කම්ම
චාතුමාසිනියං පුණ්ණමදිවසෙ අරියගණ පරිවුතො රාජකුලං
ගන්ත්වා භොජනාවසානෙ මහාරාජ අම්හෙහි චිරදිට්ඨො සම්මා
සම්බුද්ධොති ආදිවචනමබ්‍රවී"—පවාරෙත්වා යනු, වප්පුර පස
ළොස්වක්වූ මහා පවාරණයෙහි පවාරණය කොටය "කත්ති
ක පුණ්ණමායං" යනු ඉල්පුර පසළොස්වක්හිය-මිහිඳුමහ තෙ
රුන්වහන්සේ වනාහි පෙර වස්එළඹ වසනලද වස්ඇතියේ
මහාපවාරණයෙහි පවාරණයකොට ඉන්මතු එකමසක්ඉක්ම
වා සාරමස කෙළවර පුරපසළොස්වක් දවස්හි ආර්‍යසමූහයා
විසින් පිරිවරණලද්දේ රජගෙට ගොස් භොජනාවසානයෙහි
මහරජ අපවිසින් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ දැක බොහෝ
කල් වූයේය යනාදි වචනය වදාළේයි—"එවඤ්ච කත්වා වක්ඛති,
පුණ්ණමායං මහාවීරෙ චාතුමාසිනියා ඉධාති"—මෙසේදකොට
කියන්නේය, මෙහි චාතුමාසිනී පෞර්ණමාසියෙහි මහාවීර තෙ
මේයි—"යං පනෙත්ථ කෙනචි වුත්තං වුත්ථවස්සො පවාරෙත්වා
ති, චාතුමාසිනියා පවාරණායාති අතො, පඨම පවාරණා යෙව
වා පවාරෙත්වා එකමාසං තත්ථෙව වසිත්වා කත්තික පුණ්ණ

මියං අපොව අසඤුඵා පුණ්ණමායං මහාවිරෙණි වුත්ත නතා න සකකා ගණෙතුනානි''—වුත්ථවසො පවාරෙන්ති යනු, චාතුමාසිනි පවාරණයෙහි යන අර්ථයි, ප්‍රථම පවාරණයෙහිම හෝ පවරා එකමසක් එහිමැවැස කාර්තික පෞණ්මාසියෙහි වදාළේයි, අනික් පරිද්දෙකින් "පුණ්ණමායං මහාවීරෙ'' යි කියනලද බැවින් ගන්ට නොහැකියි, යමක් වනාහි මෙහි කිසි කෙනෙක් විසින් කියනලද්දේද-"තස්ස චාතුමාසිනියා පවාරණායානි අය මක්ඛිකපෙපා නඤ්ඤජිනි නාහි පුරිමිකාය උපගතා චාතුමාසිනියං පවාරෙන්ති''-එහි චාතුමාසිනී පවාරණයෙහිය යන මේ අර්ථ විකල්පයතෙම නොයෙදේ, පෙර වස්එලඹුනෝ චාතුමාසිනියෙහි පවාරණය නොකෙරෙත්-චාතුමාසිනියා පවාරණාය යනාදි පාඨය, වජිර බුද්ධිටිකාවෙහි ලියාතිබේ-ඒ කියන ලද්දේ නම්, අටුවාවෙ, වස්වසා පවාරණය කොට චාතුමාසිනී පෞණ්මාසිදින රජහට මෙය වදාළේයයි පවාරණකළ දිනහෝ එයතර මාසයක් පසුකලබවහෝ නොදක්වා තිබෙයින්, වජිර බුද්ධි ටීකාවෙහි, චාතුමාසිනියෙහි පවාරණය කොටය නොහොත් පූර්ව පවාරණයෙහි පවරා මසක් එහිවාසයකර කාර්තික පෞණ් මාසියෙහි වදාළේයයි කියනලදී-එසින් චාතුමාසිනියෙහි පවාරණයකරලාය යන අර්ථ විකල්පය නොයෙදෙයි, පෙර වස් එලඹුනෝ චාතුමාසිනියෙහි පවාරණය නොකෙරෙත් යයි සාරාර්ථ දීපනියෙහි භගවා වුන්නේය—උපද්‍රවයක් නැතුව පෙරවස් එලඹුනෝ චාතුමාසිනියෙහි පවාරණය නොකරෙත්මැයි—මේ ටීකාදෙකේම පූර්ව පවාරණයට චාතුමාසිනියෙහිය කීවේනැත—චාතුමාසිනී දෙකක් තිබුනානම් පෙරවස් එලඹුනෝ චාතුමාසිනියෙහි නොපවරත්යයි කියයුතු නොවේ චාතුමාසිනී දෙකෙකන් අනතිම චාතුමාසිනියෙහි නොපවරත් යයි කියන්ට යුතුවඇත—"නහි චාතුමාසිනියං පවාරෙන්ති'' යන වචනයෙන්ම චාතුමාසිනි දෙකක් නැතිබව සිතිඇති කාටත් හැකේ—තවද, මේ මහෙනුසර ථිරයන්වහන්සේ ලංකාවට වැඩිය වර්ෂයේ වස්විසිමත් විනය අටුවා ටීකාදි යෙහි විස්තර කථාවක් කොට කියාතිබෙන්නේය—එහි අධිකයක් තිබුනානම් මෙපමණ විස්තරකියන ආචාර්ය වරයන්ට ඒ බවත් වැඩි මාත්‍රයිනැතුව සවල්පවචනයකින් කියන්ට පුළුවනැයි කාට නම් නොසිතේද?— තවද, අටසැටලෙනෙ ගල්කම්මානත බොහෝ නිසා ඇසළමාසෙ තෙළෙස්වක්දිනපටන් පසළොස්වක් දිනදක්වා රජහට කරවන්ට නොහැකිය ඉන්නිසා නව මාසයක් කම්මානත කරවන්ට ඇත, ඒ මාසය අධිකයයි

ඒ අයම කියත්—ඒ මහානිෂ්ප්‍රයොජන කීමකි—ඒ අතර තවත් මාසයක් නැතිබව දීපවංසයෙහිත් කියාතිබෙයි—ඒ සැටඅටක් තිබුන ගල්ලෙන්වලැ කටයුතු කර්මාන්ත කරවූබව ඒ ගැන කී පාඨවලිනුත් හැඟෙයි— ඇරත්, ඒ රජවරුන්ගේ පරාක්‍රමයේ පමණත් ඒ රහතුන් වහන්සේලාට දෙවිවරුන්ගෙන් ලැබුන උපකාරවලැ පමණත් කොපමණද එකදවසකට කොපමණ කර්මාන්ත කෙරෙන්ට ඇද්ද අපට කියන්ට බැරිය—ඒ කුමකුත් නොසලකා ගල්කර්මාන්තයෙන් අධිකයක් සඳගන්ට උත්සාහ වඩාගෙනැ ගල්ලෙනුත් අමුතුවෙන්ම සැදුවාහුය ඒ කර්මාන්තයත් එකදවසකින් කරන්ටත් බැරියයි කියත් නම් එසේ කියන්නන්විසින් ඒ කර්මාන්තයේ පමණදන්නා ශිල්පීන් ලවා ඒ කර්මාන්ත කරණ පිළිවෙළින් එකලෙනක එකවිට කීදෙනෙකුට කර්මාන්ත කරන්ට පුළුවන්ද එලෙස කොට කීමාසයකින් කී අවුරුද්දකින් නිම කරන්ට පුළුවන්දැයි නියම කරවා ඒ නියමවූ මාසගණන හෝ අවුරුදුගණන හෝ, සියල්ල අධික යයි ගන්නා ලැබේවා—තවද දෙවැනි පැතිස්රජුගේ දෙවෙනි අභිෂෙකය පටන් තුන්මසක් ඉක්මවා මහෙන්ද්‍රස්ථවිරයන්වහන්සේ වැඩියාය ඒ අධිකයයි කියත්ලු—දෙවෙනි පැතිස්රජුගේ දෙවෙනිඅභිෂෙකය කෙළේ වෙසක්මස පුර පසළොස්වක දිනහෙයින් එතැන පටන් තුන්මසක් පොසොන් මාසේ පුරපසළොස්වක දිනට පසුවූනානම් එතැන දෙමාසයක් අධික වියයුතුය, ඒ අධික සියල්ලම ඇසළ මාසේට පූර්වූ අන්දමකුත් එයින් පෙනෙන්නා—ඒ කිම අටුවාවට අතියයින්ම විරුඬයි— එනම්, සමන්ත පාසාදිකාවෙහි— "සචායං රාජා තං දිවසං අසොකරඤ්ඤො පෙසිතෙන අභිසෙකෙන ඒකමාසාභි සිත්තො හොති විසාඛ පුණ්ණමියං හිසස අභිසෙකං අකංසු"—ඒ මේ රජ තෙමේද එදවස්, අශොක රජහු විසින් එවනලද අභිෂෙකයෙන් අභිෂික්තව එකමසක් ඇතිවූයේ වේ, වෙසක්පුර පසළොස්වක්හි වනාහි ඕහට අභිෂෙක කළාහුය—දෙවෙනි පැතිස් රජහුගේ පළමුවෙනි අභිෂෙකය කෙළේ, උඳුවප්මාසෙදිය—ඒබැව් මහා වංශයෙහි—

"තෙ මගග සිරමාසසස ආදිචන්දොදයෙ දිනෙ,
අභිසිත්තඤ්ච ලංකින්දං අමච්චා සාමිභත්තිනො

ධම්මාසොකසස වචනං සුත්වා සාමිහිතෙ රතා
පුනාපි අභි සෙචිංසු ලංකාහිතසුඛෙ රතං"

උඳුවප්මාසයෙහි පළමුවෙනි චාන්ද්‍රොදය ඇති දිනයෙහි අභි

ෂෙකකරණ ලද්දෑවූද ලක්දිව් වැස්සන්ගේ වැඩ සැපදෙක්හි ඇලුනාවූ ලංකාධිපතිරජ, ස්වාමියා කෙරෙහි භක්තිඇති ස්වාමියාගේ වැඩෙහි ඇලුනාවූ ඒ අමාත්‍යයෝ, ධර්මාශොක රජහුගේ වචනය අසා නැවතද අභිෂෙක කළාහුය—දෙවෙනි අභිෂෙකය කෙළේ වෙසක්මාසේ දීය-ඒ බැව් දීපවංසයෙහිදූ,

"අභිසිතෙතා දුතියාභිසෙකෙන විසාඛ මාසෙ උපොසථෙ
තතො මාසං අතිගය්හ ජෙට්ඨමාසෙ උපොසථෙ
මහින්‍දො සත්තමො හුත්වා ජම්බුදීපා ඉධාගතො"—

වෙසක්මස උපෝසථයෙහි දෙවෙනි අභිෂෙකයෙන් අභිෂෙක කරණලද්දේය එතැන් පටන් මාසයක් ඉක්මවා පොසොන්මස උපෝසථ යෙහි මහෙන්‍ද්‍රස්ථවිරතෙම සත්වෙනිවැ දඹදිවින් මෙහි වැඩියේය-මෙහි "තතො මාසං අතිගය්හ"ය නු ඇතම් සාරාර්ථදීපනී පොතෙක"තතො මාසෙ අතිගය්හ" කියාතිබෙයි—එහි "මාසෙ" කිවත් සප්තමී එකවචනයවූ කලැ අවිරුද්ධයි—කම් බහුවචනයයි අර්ථගතහොත් "එකමාසාභි සිතෙතාහොති" යන අටුවා වචනයෙන් විරුද්ධවන හෙයින් ඒ නොයෙදේ-බුරුම අකුරුවලින් තිබුන පොතකින් පිටපත් කරණලද දීපවංසයෙක "තයොමාසෙ අතික්කම්ම ජෙට්ඨමාසස්සුපොසථෙ" කියා තිබෙයි, ඒ පිටපතේ වරදවියයුතුය, ඒබව දීපවංසයෙන් සාරාර්ථදීපනියෙහි ලියනලද ලියමනේ, තයො නොකියා තතො කියා තිබෙන බැවින් විශෙෂයෙන්ම හැගේ-තයො යන පිටපත නිර්දොෂ වශයෙන්ම ගෙනැ කියන්නාවූ ඇතම් කෙනෙක්, ඒ අධිකනිසා වෙසක්මස පෞර්ණමාසිය පටන් පොසොන්මස පෞර්ණමාසිය දක්වා තුන්මසකැයි කියත්, එකල්හි ඒකීම "එකමාසාභිසිතෙතා" යන අටුවා පාඨයෙන්ද "එකො මාසො අභිසිත්තස්ස අස්සාති එක මාසාභිසිතෙතා" යන ටීකාවචනයෙන්ද අතිශයින් විරුද්ධව පෙනෙනු පමණකුත් නොව එතැනම මාස දෙකක් අධිකයයි කිවාක් මෙන් මහා වියවුලක් පෙනෙන්නේමය—

තවද, එතැන මාසදෙකකුත් අටසැට ලෙන් කථාවේ තව අධිකයකුත් කීවාම අධික රාශියක් වාගේ පෙනේ—

තවත්, ඒ වසේ අධිකයක් නම්, වස්සුක්කඩ්ඪනය කරණ හැම අවුරුදු වලම පළමුවෙනි ඇසළමසැ පෞර්ණ මාසිය ගෙවා අධිකය අරිනහෙයින්, ඇසළමාසය ලඟ අධිකයක් නොපෙන්වා ඉන් ඉහත මාස කීපයක් පෙන්නුවාසින් වත් ඒ අවුරුද්දෙ අධික ඇරීමකැයි කාටනම් වැටහේද—නොවැට

ගේමැයි—එබැවින් අටුවා ටීකාවලටත් එකඟනොවන ක්‍රමවි
රුද්ධ ක්‍රමක් ලෙඛනයෙක දෘෂයෙන් ගෙනැහැර දැක්වීම යු
තු නොවේ—තවද, දෙවැනි පැතිස්රජ පළමුවෙනි අභිෂෙක
ය ලැබුවේ, උඳුවප් මාසෙදිය—ඒ මාසෙදිම මුටසිව රජ කාල
ක්‍රියා කරන්ටත් ඇත—ඒ කාලෙද්දී මහේන්‍ද්‍රස්ථවිරයන්වහන්
සේ ලංකාවට වඩින්ට අවසර ගත්තාසින්පසු පොසොන් ම
සැ පුර පසළොස්වක දක්වා මාස හතක් පසුකළබව මහා
වංසයේ පේනහෙයින්ද, එහි වැඩිමාස ගණනක් නැතිබව
පෙනේ—ඒ කාලේ මාස ගණන් සෙවීමෙන් මෙශ්‍රැකී වසට
ප්‍රයොජනයකුත් නැතිබව පැහැදිලිව වැටහේ—මාසපිළිවෙ
ළ මින්ඉහත අපවිසින් කළ ලියමන්වලැ මෙපමණ ලකුණු
වශයෙන් දක්වානැත-මාසපිළිවෙළැ නොහඳුනන්නන්ට අධි
ක මාසය ඇති අවුරුද්දත් ඇඳිනගැන්ම දුෂ්කරහෙයින් මේ
සංක්‍ෂෙප ලිඛිතය බලා ඇඳිනගන්නන්විසින් තව විස්තරවශ
යෙන් දැනගන්නා පිණිස කාලවිධාන ටීකා සිද්ධාන්ත වෙද
විනිශ්චය මණ්ඩඨී මුක්තාවලිආදී පොත්බලා විස්තර වශයෙන්
දැනගත යුතුයි—සංක්‍ෂෙපයෙන්, වස්එළඹීම පිණිස මාස
පිළිවෙළයයි කියන්නේ චාන්ද්‍ර මාසපිළිවෙළයි-එයාකාර කී ක
ලැ ඇතම් කෙනෙක් මාසපිළිවෙළ එකක්දැයි කියා වියවුල්
කථා කරණහෙයින් අවුල්හැර මාසවලැ ඉම් කීපයම කියන්ට
ඉගෙන ගතයුතුයි—එක් තැනෙක සංක්‍ෂෙපයෙන් කී ක්‍රමක්ම
අන්තැනෙක විස්තරවසයෙන් කී කලැ ඒදෙක එකිනෙකට
විරුද්ධයයි ඇතම් කෙනෙක් නුගතුන් මුළාකරණ පිණිස කියත්
එලෙසකියා අභූතයක් ඇඟවීම ඉතාම පාපයි—

එබැවි මෙයිනුත් වැටහේය, එනම්, සමන්ත පාසාදිකාවේ
තුන් තුන් අවුරුද්දෙන් වස්සුක්කඩ්ඩනය රජදරුවෝ කෙ
රෙත්යයි සංක්‍ෂෙපයෙන් තත්‍ර්‍බාහුල්‍ය වශයෙන් කියා තිබෙ
යි—විස්තර වශයෙන් කියන ආචාර්‍ය්‍යවරයන් විසින් දහනව
අවුරුද්දක් අතරදී අධිකමාස හතක් වනබැව් කියා තිබේ—

මේදෙක එකිනෙකට විරුද්ධයයි නුගත් අයට ඇඟවීම ඉතාම
සුකරයි-එහිවිනිශ්චය බැලූකලැ පෙන්වන්ට විරුද්ධඑකකොන
කුත් නැති නමුත් මේ උභතො කොටිකයෙකැයි කියන්ටත්
හැකිය-ඉන්නිසා එබඳු නිෂ්ප්‍රයොජන වචන පිළිනොගෙන ත
මන්ගේ ඥාන ශක්තියේ තරමින් ඉගෙන ගෙනම යමක් දැන
ගැන්ම ඉතා යහපතැයි කල්පනා කටයුතුයි—මේ වස්සූපනා
යිකාව සියලූදෙශවලම තත්වූ පරිද්දෙන් කළ කලැ එකාකාර
මයි-සර්වඥයන්වහන්සේවිසින් පණවනලද ප්‍රඥප්ති අතුරෙන්-

සතරක් පමණක් මධ්‍ය දෙශයෙන් පිටත් ප්‍රත්‍යන්ත වලට වෙනස්ය—එනම්, සම් ඇතිරිළිවලැ හිඳීමත්, නිතර නෑමත්, සතර පටෙත් වැඩි වහන් පයලෑමත්, පස්නමෙන් උපසම්පදා කර්මය කිරීමත්, ප්‍රත්‍යන්තවලැ වසන භික්ෂූන්ට මුත් මධ්‍යදේශ වාසීන්ට කැපනැත—

මේ වස්එලඹීම සියලූ රටවලටම එකා කාරය—

යම් යම් ශාස්ත්‍රවන්තයන්ගේ මත ක්‍රමයෙන් කලින් කලැ ඒ ඒ රටවලැ මාස ලබන ගෙවෙන ශීමා වෙනස් වෙනස් ලෙස ව්‍යවහාර කරණ නුමුත් මාසේ වැඩිවීම මේ අපට පේන හිරසඳ පවත්නා හැම රටවලටම එකාකාරයි—එබැවින් ඒ වැඩිවූන මාසය ඇරලා වස්එළඹෙන අවුරුද්දේ ඒ හැම රටවලම අධික අරිත්—ඉන්නිසා ජම්බූද්වීපය ආදි හැම රටවලම අධික මාසය අරින අවුරුද්දේ කාව්සිනුත් අධික ඇර වස්එලඹෙන පරිද්දෙන් අධිමාසය ඇඳිනගැන්මට උත්සාහ කටයුතුයි—

පුරාණ ජ්‍යොතිශශාස්ත්‍රකාරයන්විසින් චන්ද්‍ර සූර්‍ය්‍ය නක්‍ෂත්‍ර තාරකාවන්ගේ උදාවී පැවැත්ම යහපත්ව නොහොත් අයනාභෙද වශයෙන් ගමනෙන්දිත් ඉතා දුරුනොවන යහපත් මාර්ගයක් කොට ලංකාව දක්වාතිබෙන බැව්නුත් ලංකාවාසීන්ට නක්‍ෂත්‍ර ලක්‍ෂණ වලිනුත් මාස ක්‍රමය හැඳිනීම දුෂ්කර නොවේය—එබැවින් අභිනව භික්ෂූන්විසින් සාදරයෙන් රචිතවූ මේ මාසත්‍රිලක්‍ෂණය බලා අවබොධ කටයුතුයි—

සමාසතසත්‍ර ලිඛිත මෙ තනමාසත්‍රි ලක්‍ෂණම්,
නවිශෙයසීති භිසසමූක් පඨනියංහි සාදරම්—

ශාකෙ වෙතම ගජ්ජග සාගරසුතෙ භාගනෞ ගප්සෙර් නිෂෞ
මාදශහං ශශිවාසරෙ ගහණහෙ වෛශාඛ ශුකෙල නිශි
නානා තන්ත්‍ර සමුඬෘතාංශ නිවහං සම්බුද්ධ ධර්මෝ වහං
චක්‍රෙ සාධු සුමඬගලො යතිරිදං නූතනාව බො ධක්‍ෂමම්

නිම්.

# අධිමාසොත්පත්තිය දැනගැනීම
# පිණිස
# උපදෙශය.

චන්ද්‍රයාගේ ගමනින් පිරෙන මාසය චාන්ද්‍රමාස නම්—සූර්‍ය්‍යයාගේ ගමනින් පිරෙන මාසය සෞරමාස නම්—චන්ද්‍රයා රාශි දොළස ඉක්මවා ගිය කාලය චාන්ද්‍ර මාසයට ප්‍රමාණයි—සූර්‍ය්‍යයා එකරාශියක් ගෙවාගිය කාලය සෞර මාසයට ප්‍රමාණයි.

මෙසේ පිරෙන්නාවූ චාන්ද්‍ර මාසයෙන් දොළසක්වූ වර්‍ෂයට දවස් 354 ක්වේ—සෞර මාසයෙන් දොළසක්වූ වර්‍ෂයට දවස් 365 ක්වේ—චන්ද්‍රයාගේ ගමනින් මාසයක් වෙන කල්හි සූර්‍ය්‍යයාගේ ගමනින් වෙන මාසයෙන් සර්‍වසාමාන්‍ය ගණනින් විනාඩ්‍යාදි අවයව සහිතවූ සිව් පණස් පැයක් අවශෙෂ වේ—වර්‍ෂයෙක්හි ඝටිකාදි අවයව සහිත එකොළොස් දවසක් සූර්‍ය්‍ය මාසවලින් අවශෙෂ වේ—එහෙයින් යම් කාලෙක චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා සම්බන්ධ මාසදෙක එක කල්හි පටන්ගනිද එ තැන් පටන් සූර්‍ය්‍යමාසයෙන් දෙතිස් මස් පසළොස් දින තිස් එක් පැ අටවිසි විනාඩි සත්සාළිස් තත්පරයක් ගෙවෙන කලැ චාන්ද්‍රමාසයෙන් මාසයක් අධික වේ—එහෙයින් සමවූ ඍතු මාස යුක්තවූ අවුරුද්දකින් මාස ව්‍යවහාරය ආරම්භ කළ කල්හි ඊට තුන්වෙනි වර්‍ෂයෙහි ඒ වැඩිවූ මාසය අධික වශයෙන් හැරිය යුතුයි—පූර පැළවිය පටන් අමාවක දක්වා චාන්ද්‍ර මාසය ව්‍යවහාර කරන ක්‍රමයෙන් මිථුන රවියේ යෙදුන පූර පැළවියෙන් පටන්ගත් ඇසළ මාසය ඒ ලඟ අමාවකින් අවසන් වේ—අව පැළවියෙන් පටන් ගෙන පුණු පසළොස්වක දක්වා මාසයයි ව්‍යවහාර කරණ මාස ක්‍රමයෙන් එම මාසය ඊට පසළොස් දවසක්න් පූර්‍වයෙහි අවසන් වේ—එසේම—පූර පැළවිය පටන් අමාවක දක්වා ගෙවෙන අධික මාසයට පූර පසළොස්වක දක්වා ගෙවෙන අධිකමාස වශයෙන් පසළොස් දවසකට පූර්‍වයෙහි අවසන්වේ—

දඹදිව මධ්‍යදෙශ යෙහි ඒ බැව් ප්‍රකාශකර තිබෙන පොත් බොහෝ රාශියකින් ඒ බව මාසත්‍රී ලක්‍ෂණයෙහි ප්‍රකාශ කර ඇති—

මධ්‍ය දෙශයෙහි පවත්නා සිද්ධාන්තවලද මෙසේම ප්‍රකාශයි—එයින් සිද්ධාන්ත සිරෝමණි පොතෙහි මෙසේ ඉපනේ—

"සෞරාත් මාසා දෛන්‍යුවඃ සකලලඝියාන්.
[illegible]තත්සමාත්සංඛ්‍යයා තෙධිකාඃ ස්‍යුඃ
චාන්‍ද්‍රාඃ කල්පෙ සෞර චාන්‍ද්‍රාන්තරෙයෙ
මාසාස්තජ්ඥෛසතධිමාසාඃ ප්‍රදිෂ්ටාඃ"—

යස්මාත්, යම්හෙයකින්; ඓන්‍දවඃ, චාන්‍ද්‍රමාසය තෙම; සෞරාත් මාසාත්, සෞර මාසයෙන්; ලඝියාන්ස්‍යාත්, අතිශයෙන් සැහැල්ලු හෙවත් කොට වන්නේද; තස්මාත්, එහෙයින්; සංඛ්‍යයා, ගණිතින්; තෙ, ඒ චාන්‍ද්‍රමාසයෝ; අධිකාඃ ස්‍යුඃ, වැඩිවෙත්; කල්පෙ, කල්පයෙක්හි; සෞර චාන්‍ද්‍රාන්තරෙ, සෞරමාස චාන්‍ද්‍ර මාසයන් ගේ අතර; යෙ චාන්‍ද්‍රාඃ මාසාඃ, යම් චාන්‍ද්‍රමාසයෝවෙද්ද; තජ්ඥෛඃ, ඒ දන්නවුන් විසින්; තෙ, ඒ මාසයෝ; අධිමාසාඃ ප්‍රදිෂ්ටාඃ, අධිමාසයයි දක්වන ලද්දාහුය; හෙවත් කල්පනා කරණ ලද්දෝය—

මිතාක්‍ෂරා ටීකාවෙනි—

සෞර මාසකුදිනෙභ්‍යශ්චාන්‍ද්‍ර මාසකුදිනෙෂු ශොධිතෙෂු ශෙෂං දිනස්ථානෙ පූර්‍ණමධශ්චතුෂ්පඤ්චාශත් ඝටිකාඃ සප්ත විංශති ඵලානි සාවයවානි එකස්මිං සෞරමාස ඉදං සෞර චාන්‍ද්‍රාන්තරං කුදිනාත්මකං යුගසෞදෙරූපයෙයී කාශ්මින් දක්‍ෂිණෙන ප්‍රාපෙන එකශ්චාන්‍ද්‍රමාසඃ පූර්‍ණසත්දනන්තරං චතුඃ පඤ්චාශත් ඝටිකාභිඃ සාවයවාභිම්ධ්‍ය මාසීස්‍ය චෘෂභ සංක්‍රාන්තිස්තත්‍ර රවිමාසඃ පූර්‍ණස්තතොන්‍යස්මින් දක්‍ෂිණෙන ප්‍රාපෙන න්‍යශ්චාන්‍ද්‍රමාසාන්තඃ තතො දක්‍ෂිණාන්තාදුපරි ද්විගුණාභිස්තාභිරෙව ඝටිභිර්මිථුන සංක්‍රාන්තිඃ එවං ත්‍රිගුණ චතුර්ගුණාදිභිඃ කර්කටාදි සංක්‍රාන්තයො භවන්ති එවං සංක්‍රාන්ති රග්‍රතොග්‍රතොයාන්ති පුනඃ දක්‍ෂිණාන්තං ප්‍රාපෙනාති තදාගතචාන්‍ද්‍රමාසෙභ්‍යඃ සෞරා එකොනා භවන්ති යදා සංක්‍රාන්තිර්දක්‍ෂිණාන්ත මතික්‍රාම්‍යග්‍රතොයාති තදා පෘථෙන යාවන්තඃ සෞරා භවන්ති තාවදභිරෙකොධි මාසඃ—

තත්‍රානුපාතඃ යද්‍යනෙන සෞර චාන්‍ද්‍රාන්තරෙණ කුදිනාත්මකෙන—54—27—32—එකඃ සෞරෙමාසො භවති තදා චාන්‍ද්‍රමාසාන්තඃ පාතීභිඃ කුදිනෙඃ—29—31—50–කියන්ත ඉතිඵලං ප්‍රයයී මාසාඃ—32—15—31—28—4.—

මෙහි භාවය—

සෞර මාසයකම ඇත්තාවූ භූමි දිනවලින් චාන්‍ද්‍රමාසයට ඇති භූමිදින හැරිය කල්හි ශෙෂය දිනස්ථාන යෙහි සම්පූර්ණයි භාත සිව්පණස් පැයක්හා අවයව සහිත සත්විසි විනාඩියයි පැ—54-27-31-52-30—එක සෞර මාසයෙක්හි සෞර චාන්‍ද්‍රමාය

දෙකෙස් අතර භූමිදින ස්වභාවෙන් මෙපමණයි- යුගය පමන් ගැන්මේ මත්තෙහි එක අමාවක අනතයක් පැමිණි කල්හි එක චාන්ද්‍රමාසයක් පිරුනේයි—ඊට අනතුරුවූ අවයව සහිත සිව්පාණස් පැයකින් මධ්‍යමවූ සූර්‍ය්‍යයාගේ වෘෂභ සංක්‍රාන්තිය වේ—එහි සූර්‍ය්‍ය මාසය පිරුනේයි—එයින් අන්‍යවූ අමාවක් අනතයක් පැමිණි කල්හි අන්‍යවූ චාන්ද්‍රමාසයක් වේ එයින් අමාවක් අනතයෙන් මත්තෙහි ද්විගුණ ත්‍රිගුණවූ එම පැවලින් මිථුනසංක්‍රාන්තිය වේ-මෙසේ ත්‍රිගුණ චතුර්ගුණාදිවූ පැවලින් කර්කටකාදි සංක්‍රාන්තිහු වෙත්—මෙසේ සංක්‍රාන්ති තොමෝ මතු මත්තේ යෙයි—

නැවත අමාවක් අනතයට පැමිණේ එකල්හි ගියාවූ චාන්ද්‍ර මාසවලින් සූර්‍ය්‍යමාසයෝ එකක් අඩුවෙත් යම් කලෙක සංක්‍රාන්තිය අමාවක් අනතය ඉක්මවා ඉදිරියෙහි යේද එකල්හිප සුපස්සෙ වැටීමෙන් යම්තාක් සූර්‍ය්‍යමාසයෝ වෙද්ද එපමණින් එක අධික මාසයයි එහි අනුවූ වැටීම ඉදින් භූමිදින ස්වභාවූ මෙපමණින් පැ—54—27—32-එක සූර්‍ය්‍ය මාසයක් වේනම්-එකල්හි චාන්ද්‍රමාසානත යෙහි වැටෙන්නාවූ—29—31—50—භූමිදිනවලින් කොපමණද යත් ලැබෙන ඵලය සූර්‍ය්‍ය මාසයෝය-එනම්—මාස—32—දින—15—පැ31—විනාඩි—28—තත්පර-47 මෙහි කියන ලද පරිද්දෙන් ප්‍රකෘති සමකාල යෙහි අමාවක අනතයද—රවි සංක්‍රාන්තියද එකදින පටන් ගෙනැ ක්‍රම ක්‍රම යෙන් අමාවක පසුවෙව් යනකල්හි අධිමාසය පිරුනු කල්හිද නැවත චන්ද්‍ර සූර්‍ය්‍යයන් එකතුවීමෙන් වන අමාවක සහ සංක්‍රාන්තිය යෙදෙන ස්වභාව නිසාම රවි සංක්‍රාන්තිය හා අමාවක යෙදුම අධිමාස ඇති වර්ෂයේ ලකුණක්ව තිබේ—එම වර්ෂයෙහි එක දුණු පසළොස් වකට අයත් නැකතින් යුත් පෞර්ණමාසි දෙක යෙදේ—ඉන්නිසා එහි පසළොස්වකේ අධිකත්වය දත යුතුයි—එක සූර්‍ය්‍යමාසයක් තුල්හි පෞර්ණමාසි දෙකක් යෙදුනායින් පසළොස්වකක අධිකයක් නොවේ

නිමි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු